# ස්ථාවර ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

**ආපදා ස්ථානීය අංක . 228**

**කොටගල - අඹේවෙල අතර දුම්රිය මාර්ගයේ බැවුම් කඩා වැටීමකට ලක් වූ ස්ථානය**

**(CH 134/78)**

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

**අප්‍රේල් 2026**

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
ASIAN INFRASTRUCTURE INVESTMENT BANK

වෙනුවෙන්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දු.ක. 011-2588946, 011-2503431, 0112-2500354

සකසන ලදී

පටුන


**1.** හැඳින්වීම ........ **1**

1.1 ව්‍යාපෘති පසුබිම ........ 1

1.2 අපේක්ෂිත පරිශීලකයන් ........ 1

**2.** නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය ........ **1**

2.1 ව්‍යාපෘතියේ නම ........ 1

2.2 ව්‍යාපෘති ස්ථානයේ පිහිටීම ........ 1

2.3 භූ ලක්ෂණ සහ ඉඩම් අයිතිය ........ 2

2.4 ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණ ........ 3

**2.5** ප්‍රදේශයේ ජන විකාශන ලක්ෂණය ........ 3

**3.** සිදුවූ නායයෑම් උපද්‍රව පිළිබඳ තොරතුරු ........ **3**

3.1 නායයෑම් ආපදාවේ ස්වභාවය ........ 3

3.2 නායයෑමෙන් සිදුව ඇති බලපෑම හා ප්‍රතිවිපාක ........ 3

3.3 පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග ........ 4

3.4 ඉවත් කිරීම් ........ 4

මෙම ස්ථානය සඳහා ඉවත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. ........ 4

3.5 නැවත පදිංචි කිරීම ප්‍රගතිය ........ 4

**4.** පාෂාණ කඩා වැටීම සිදුවන ප්‍රදේශය**,** ඊට යාබද ප්‍රදේශ සහ වර්තමාන අවදානම් මට්ටම පිළිබඳ තොරතුරු ........ **6**

4.1 නායයෑමේ ප්‍රදේශය ........ 6

4.2 පාෂාණ කඩා වැටීමේ ප්‍රදේශයට යාබද ප්‍රදේශය ........ 7

4.3 වර්තමාන අවදානම් ස්වභාවය ........ 7

**5.** ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන් ........ **7**

**6.** ව්‍යාපෘති ක්‍රියාවන් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී ඒකක සහ හානි වූ ඒකක පිළිබඳ විශේෂ සඳහනක් සහිත අවට පරිසරය පිළිබඳ කෙටි හැඳින්වීමක් ........ **8**

**7.** ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ**,** පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම ........ **10**

7.1 හිතකර බලපෑම් ........ 10

7.2 අහිතකර බලපෑම් ........ 10

7.2.1 **ජල විද්‍යාත්මක බලපෑම්** ........ 11

**7.2.1.1** ප්‍රදේශයේ ජලාපවහන රටාව කෙරෙහි බලපෑම ........ **11**

**7.2.1.2** ජල දූෂණය සම්බන්ධයෙන් ඇති බලපෑම ........ **11**

**7.2.1.3** බාදන බලපෑම් සහ ගංගාවන්හි පතුල වෙනස් වීම ........ **11**

**7.2.1.4** අක්‍රමවත් වැසිකිළි භාවිතය නිසා ජලයෙන් පැතිරිය හැකි ආසාධන ........ **11**

**7.2.1.5** පහළ ප්‍රදේශයේ ජල පරිභොජකයන්ට ඇති විය හැකි බලපෑම් ........ **11**

**7.2.1.6** භූගත ජල මට්ටමට හා භූගත ජලයේ ගුණාත්මකභාවයට විය හැකි ........ **11**

7.2.2 **පාරිසරික බලපෑම්** ........ 12

**7.2.2.1** ශබ්දය හා කම්පන මගින් ඇති විය හැකි බලපෑම් ........ **12**

**7.2.2.2** වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම ........ **12**

**7.2.2.3** ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු ........ **12**

**7.2.2.4** පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය භාවිතය ........ **12**

7.2.3 ජීව **විද්‍යාත්මක /පරිසර විද්‍යාත්මක බලපෑම** ........ 12

**7.2.3.1** සැලකිය යුතු වනජීවී වාසස්ථානවල බලපෑම් **........ 12**

**7.2.3.2** සත්ත්ව හා ශාක විශේෂ කෙරෙහි බලපෑම් **........ 12**

7.2.4 **සාමාජීය හා ආර්ථික බලපෑම්** ........ 13

**7.2.4.1** ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල හෝ යාබදව පිහිටා ඇති කෘෂිකාර්මික බිම් **........ 13**

**7.2.4.2** කම්පන නිසා ගොඩනැගිලි වලට විය හැකි බලපෑම **........ 13**

**7.2.4.3** භූමියට සහ අනාගත සංවර්ධන කටයුතුවලට ප්‍රවේශය අහිමි වීම **........ 13**

**7.2.4.4** ජීවනෝපාය/ව්‍යාපාර සහ ආදායම් උපයන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් **........ 13**

**7.2.4.5** සේවා සැපයීම කෙරෙහි ඇති වන බලපෑම (ජල සැපයුම**,** අපජලය**,** විදුලිය)**........ 13**

**7.2.4.6** යටිතල පහසුකම් සහ ආරක්ෂාව අහිමි වීම හේතුවෙන් ඇති වන බලපෑම **........ 13**

**7.2.4.7** කඳවුරු සහ ව්‍යාපෘති භූමිය ස්ථානගත කිරීමේ අවශ්‍යතා **........ 13**

**7.2.4.8** සහ කාර්ය මණ්ඩලය / ව්‍යාපෘති භූමිය අවට ජීවත් වන පුද්ගලයින් අතර සබඳතා සහ ආරවුල් ඇතිවීමේ හැකියාව **........ 13**

**7.2.4.9** ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව **........ 13**

**7.2.4.10** ඉදිකිරීම් කටයුතු මගින් මහජනතාවට ඇතිවන ආරක්ෂාව: මගීන් සඳහා පවතින ඉහළ අවදානම **........ 14**

**7.2.4.11** ප්‍රවාහන යටිතල පහසුකම් කෙරෙහි ඇතිවන බලපෑම් (විශේෂයෙන් මාර්ග හෝ දුම්රිය ප්‍රවේශය තාවකාලිකව අහිමි වීම**,** මාර්ග තදබදය මගින් ඇතිවන අවදානම) **........ 14**

**8.** ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය **........ 14**

**9.** සැලකිය යුතු පාරිසරික හා සමාජ බලපෑම් **........ 15**

9.1 සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබධ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය :කොන්ත්‍රාත්කරුවන්  සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා  ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කරුණු ........ 15

9.2 ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම ........ 15

**10.** පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම **(ESMP) ........ 15**

10.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ........ 15

10.2 පදිංචි ජනතාව ඉවත් කිරීම ........ 15

10.3 හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය) ........ 15

10.4 ව්‍යාපෘතීය ක්‍රියාමාර්ග හේතුවෙන් දේපල/භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ගෙවීම ........ 15

10.5පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම........ 15

10.6 සැළසුම් මත පදනම් වූ පාරිසරික සමාජ කළමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම........ 15

10.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම ........ 17

10.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන්........ 17

10.7.2 නාය ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම ........ 18

10.7.3 ස්ථානයට අදාල විශේෂිත අධීක්ෂණ තත්ත්වයන් ........ 21

**11.** පදිංචි ජනතාව සහ පාර්ශවකරුවන්ගේ උපදේශන - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන් **........ 22**

11.1 මහජන උපදේශන........ 22

11.2 දැනුවත් කිරීම්  සඳහා සම්බන්ධ වූ පාර්ශවකරුවන්  උපදේශනවලදී ලබා දුන් නිර්දේශ හෝ එකඟතාවන් (ඇමුණුම II බලන්න) ........ 22

**12.** ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යෝග්‍යතා , කැමැත්ත ප්‍රකාශනය , එකඟතාව සහ අනුමත කිරීම්.... 22
12.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ........ 22
12.2 ව්‍යාපෘතියට අදාළ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය ........ 23
12.3 පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබාගැනීම/නෛතික බැඳීම/ විරුද්ධත්වයක් නොමැති වීම ........ 23
**13.** දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය ........ 24
**14.** තොරතුරු අනාවරණය කිරීම ........ 24

**ඇමුණුම් ලැයිස්තුව**

ඇමුණුම 1: ව්‍යාපෘති ප්‍රදේශයේ සහ අදහස් විමසීම් සිදුකරණ අතරතුර ලබාගත් ඡායාරූප........ i
ඇමුණුම II: පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා තුලදී අනාවරණය වූ විශේෂ කරුණු :නුවරඑලිය දිස්ත්‍රික්කය ........ i
ඇමුණුම III: රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රියා පටිපාටිය........ ii
ඇමුණුම IV: අධ්‍යන කණ්ඩායම ........ ii
ඇමුණුම V: යොමු ලැයිස්තුව........ ii

**රූපසටහන් ලැයිස්තුව**

රූපය 1: ප්‍රධාන දුම්රිය මාර්ගයේ යෝජිත නායයෑම් අවම කිරීමේ ස්ථාන........ 2
රූපය 2: ස්ථානීය අංක 228 ස්ථානය වෙත ප්‍රවේශය පෙන්වන සිතියම ........ 2
රූපය 3: යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානීය අංක 228 හා අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ ගූගල් රූපය........ 3
රූපය 4: ගූගල් රූපය, හරස් කඩ, ඉඩම් භාවිතය, අවදානම් අංග සහ ස්ථානයේ විශේෂ ලක්ෂණවල ඡායාරූප........ 5
රූපය 4: ගූගල් රූපය, හරස් කඩ, ඉඩම් භාවිතය, අවදානම් අංග සහ ස්ථානයේ විශේෂ ලක්ෂණවල ඡායාරූප........ 5
රූපය 5a: නානුඔය සිට අඹේවෙල දුම්රිය ස්ථානය දක්වා දුම්රිය මාර්ගය සෝදා ගොස්ඇත. ස්ථාන අංක: 228 (CH 134/78) ........ 8
රූපය 5b: ටර්පන්ටයින්, පයිනස් සහ මහා-රත්මල් වෘක්ෂලතාදිය සහිත ඉහළ බෑවුම ආසන්නයේ පිහිටි අවම කිරීමේ ස්ථානය........ 8
රූපය 5c: මගීන් සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙස භාවිතා කරනු ලබන සෝදා ගොස් ඇති ලද දුම්රිය මාර්ගය සහ වෘක්ෂලතාදිය........ 9
රූපය 5d: ඉහළ බෑවුම් වනාන්තර ප්‍රදේශය මහා-රත්මල් වැනි ආවේණික ශාක වලින් සමන්විත වේ ........ 9
රූපය 5e: මහා-රත්මල්, ටර්පන්ටයින් සහ අනෙකුත් පඳුරු සහිත පහළ බෑවුමෙහි වෘක්ෂලතාදිය........ 9
රූපය 5f: හානියට පත් පහල බෑවුමේ ඇති මහා-රත්මල් ශාඛ........ 9
රූපය 5g: සුන්බුන් වලින් අවහිර වී ඇති ආසන්නයේ පිහිටි බෝක්කුව ........ 9
රූපය 5h: ඉහළ බෑවුමෙහි පිහිටි ජල උල්පත් ........ 9
........ 10
රූපය 5i: ස්ථානයේ පහළ බෑවුම් ප්‍රදේශය වෘක්ෂලතා ආවරණයෙන් යුක්ත වන අතර, කාණු හරහා උල්පත් ජලය ගලා එමින් මෙම ප්‍රදේශය තෙත් සහ මඩ භූමියක් බවට පත් වී ඇත. ........ 10

## වගු ලැයිස්තුව

වගුව 1: අවම කිරීම සඳහා යෝජිත ස්ථානවල භූ ආකෘති විද්‍යාත්මක සහ පාරිසරික ලක්ෂණ පිළිබඳ නිරීක්ෂණ .. 7
වගුව 2: ගල් කඩා වැටීම් / නායයෑම් අවදානම අවම කිරීම සඳහා අවම කිරීමේ ස්ථාන ආශ්‍රිතව නිර්දේශිත ක්‍රියාමාර්ග ........ 8
වගුව 3: සෘණාත්මක බලපෑම් හා ඒවා වැදගත් වන මට්ටම ........ 11
වගුව 4: ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය ........ 14
වගුව 5: සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම ........ 16
වගුව 6: පාරිසරික හා සමාජ ආරක්ෂණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවයන් ES & HS ... 17
වගුව 7: ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනු ලබන පියවර ........ 19
වගුව 8: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර ........ 21
වගුව 9: බාධා ඉවත් කර ගැනීම්, විරෝධතා නොමැති බව, කැමැත්ත සහ අනුමත කිරීම් ........ 22
වගුව 10: අනුමැතීන් ලබාගැනීම සඳහා නියමිත කාල රාමුව ........ 23
වගුව 11: තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම ........ 24
වගුව 12: තොරතුරු රැස්කිරීම සඳහා සම්බන්ධ කරගත් ආයතන සහ නිලධාරීන් ........ 24

**කෙටි යෙදුම්**

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව<br>Asian Infrastructure Investment Bank |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය<br>Central Environmental Authority |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Forest Conservation |
| DS | ප්‍රාදේශිය ලේකම්<br>Divisional Secretary |
| DWLC | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Wild Life Conservation |
| EH & S | පරිසරික හා සමාජ ආරක්ෂණය<br>Environmental Health & Social |
| E&SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ අංශයේ පාරිසරික සමාජ ඒකකය<br>Environmental & Social Unit of Project Management Unit |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව<br>Environmental and Social Management Framework |
| SSE & SMP | ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමානාකරණ සැළසුම<br>Site Specific Environmental and Social Management Plan |
| ESMP | පාරිසරික හා සමාජ කළමනාකරණ සැළසුම<br>Environmental and Social Management Plan |
| GN | ග්‍රාම නිලධාරී<br>Grama Niladhari |
| GOSL | ශ්‍රී ලංකා රජය<br>Government of Sri Lanka |
| GSMB | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>Geological Surveys & Mines Bureau |
| NBRI | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය<br>National Building Research Institute |
| RHS | දකුණු පස<br>Right Hand Side |
| LHS | වම් පස<br>Left Hand Side |

## 1. හැඳින්වීම

### 1.1 ව්‍යාපෘති පසුබිම

ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව **(AIIB)** හා සම්බන්ධ වෙමින් එම බැංකුවේ මුල්‍ය ආධාර මත අවම කිරීමේ පියවර ව්‍යාපෘතිය මගින් නායයෑම් අවදානම අවම කිරීම**(RLVMMP)** යටතේ ශ්‍රී ලංකාවේ පළාත් 6ක දිස්ත්‍රික්ක 13ක නාය යෑම් සිදුවන සථාන පිළිසකර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය පරිසරික හා සමාජ ආරක්ෂණමය වශයෙන් **AIIB** බැංකුවේ හා ලංකා රජයේ නීතිරීතිවලට අනුකූලව සිදුවිය යුතුය. ව්‍යාපෘති යේ ස්වභාවය සහ එහි ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් **AIIB** බැකුව අපේක්ෂා කරන පරිදි ඔවුන්ගේ පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවක් **(ESMF)** සකසා ඇත.

පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවහි **(ESMF)** අරමුණු වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී **AIIB** බැංකුවේ ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික හා සමාජ ප්‍රඥප්තිය පිළිබඳ මාර්ගොපදේශයන් සැපයීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (ජා.ගො.ප.ආ.) සමස්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරණු ලබන පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුව, ව්‍යාපෘති ය ට අදාල පාර්ශවයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික, සමාජ, සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස් වන නිශ්චිත තත්වයන් පිළිබද අවධානය යොමු කිරීම වැදගත් වේ. එමනිසා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවට අනුව පාරිසරික සහ සමාජයීය ඇගයීම් සඳහා එක් එක් නායයාම් ස්ථානයට විශේෂිත වූ පාරිසරික හා සමාජ කළමනාකරණ වාර්තා **(SSE & SMP)** සකසා ඇත. එම ස්ථානයේ විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණය පිළිබද සැළසුම් මගින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන්, සෞඛ්‍ය, සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්දයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබද ඉදිකිරීම් සහ මෙහෙයුම් කාලය තුල අවශ්‍ය මග පෙන්වීම් ලබාදෙනු ඇත.

මෙම විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම **නුවරඑළි දිස්ත්‍රික්කයේ කොටගල -අඹේවෙල දුම්රිය මාර්ගයේ (CH 134/78) ඇති අස්ථායී බැවුම** නායයෑම් අවම කිරීමේ ස්ථානය සඳහා සකස් කර ඇත. ගැඹුරු **පාරිසරික හා සමාජ අධ්‍යයනයකින් පසුව සකස් කර ඇති මෙම සැළසුම මගින් පහත කරුණු පිළිබඳව ඉහළ අවධානයක් යොමු කර ඇත**

i. ව්‍යාපෘතියට අදාල කලාපයේ සංවේදී පාරිසරික හා සමාජීය අංග හඳුනා ගැනීම.
ii. ව්‍යාපෘතිය හේතුවෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම.
iii. හානිය අවම කරන පියවර යෝජනා කිරීම.
iv. මෙම ව්‍යාපෘතියට අදාල වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම.
**v.** ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර අදාළ පාරිසරික නියාමයන් හා ක්‍රියාපටිපාටීන් අධ්‍යනය කිරීම.

### 1.2 අපේක්ෂිත පරිශීලකයන්

යෝජිත ව්‍යාපෘතිය හා සම්බන්ධ පාරිසරික හා සමාජීයගැටළු, සහ නාය යාම අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ගැඹුරු අවබෝධයක් මෙම වාර්තාවෙන් සපයන අතර නායයෑම් අවම කිරීමේ සැලසුම් කණ්ඩායම, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති යේ පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවෙහි අඩංගු සංරචක, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කිරීමට අදහස් කරයි. නිශ්චිත පාරිසරික කළමනාකරණ සැලසුම ( https://rlvmmp.lk/) වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරණු ලබන අතර මේ සම්බන්ධයෙන් පුළුල් පරාසයක උනන්දුවක් දක්වන පාර්ශවයන්ට (පොදු ජනතාව, වෙනත් ආයතන/සංවිධාන) පරිශීලනය කල හැක. කොන්ත්‍රාත්කරුවන්ටද වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති මෙම ස්ථානීය පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම (ESPM) පරිශීලනය කර, ඔවුන් විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර සකස් කළ යුතු ස්ථානීය පාරිසරික හා සාමාජීය කළමනාකරණ ක්‍රියාකාරී සැළැස්ම (SSE-SMAP) සකස් කිරීමේ පදනම ලෙස යොදාගත හැක.

## 2. නායයෑම් සිදුවූ ස්ථානයේ තොරතුරු සහ පිහිටීම පිළිබඳ විස්තරය

### 2.1 ව්‍යාපෘතියේ නම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ස්ථානීය අංක 228 හි කොටගල -අඹේවෙල දුම්රිය මාර්ගයේ (CH 134/78) ඇති අස්ථායී බැවුම සඳහා අවම කිරීමේ සැලැස්ම.

### 2.2 ව්‍යාපෘති ස්ථානයේ පිහිටීම

යෝජිත අවම කිරීමේ ස්ථානය මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයයේ,නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ පරිපාලන කටයුතු සිදුවන 447A අඹේවෙල ග්‍රාම නිලධාරී වසමට අයත් වේ.


ස්ථානීයයේ GPS ඛණ්ඩාංක - 6.885416° N සහ 80.788250° E

ආපදා ස්ථානයට ආසන්නතම දුම්රිය ස්ථානය හා ප්‍රවේශය – අඹේවෙල දුම්රිය ස්ථානය (ස්ථාන කේතය – ABL) ප්‍රධාන දුම්රිය මාර්ගයේ 64 වන දුම්රිය ස්ථානය වේ. මෙම දුම්රිය ස්ථානය කොළඹ කොටුවේ සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 223 ක දුරකින් පිහිටා ඇත. එය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නාවලපිටිය මෙහෙයුම් කලාපය යටතේ පවත්වාගෙන යනු ලැබේ. යෝජිත නායයෑම් අවම කිරීමේ අඩවිය අඹේවෙල දුම්රිය ස්ථානයේ සිට නානුඔය දුම්රිය ස්ථානය (ප්‍රධාන දුම්රිය මාර්ගයේ 62 වන දුම්රිය ස්ථානය, කේතය – NOA) දෙසට ආසන්න වශයෙන් කිලෝමීටර් 3.32 ක දුරකින් පිහිටා ඇත.

*(වැඩිදුර අධ්‍යනය සඳහා පිළිවෙලින්, ප්‍රධාන දුම්රිය මාර්ගයේ යෝජිත නායයෑම් අවම කිරීමේ ස්ථාන අංක 228 වෙත ප්‍රවේශය පෙන්වන සිතියම් සඳහා රූප සටහන් 1 සහ 2 වෙත යොමු වන්න.)*




*රූපය 1: ප්‍රධාන දුම්රිය මාර්ගයේ යෝජිත නායයෑම් අවම කිරීමේ ස්ථාන.*




*රූපය 2: ස්ථානීය අංක 228 ස්ථානය වෙත ප්‍රවේශය පෙන්වන සිතියම*

**2.3** භූ ලක්ෂණ සහ ඉඩම් අයිතිය

ස්ථානීය අංක 228 උඩරට දුම්රිය මාර්ගයේ නානුඔය දුම්රිය ස්ථානයේ සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 15.2 ක දුරකින් පිහිටා ඇත. මෙම ස්ථානය මධ්‍යම මුහුදු මට්ටමේ සිට මීටර් 1823 ක උසකින් පිහිටා ඇති අතර, හානියට පත් දුම්රිය මාර්ග කොටසේ දිග ආසන්න වශයෙන් මීටර් 300 කි.

*(වැඩිදුර අධ්‍යනය සඳහා: යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානය අංක 228 හා අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ ගූගල් රූපය 3 බලන්න)*




*රූපය 3. යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානීය අංක 228 හා අවට පාරිසරික ලක්ෂණ සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ ගූගල් රූපය.*

**2.4** ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණ

වාර්ෂික දල වර්ෂාපතනය – 228.4 මි.මී
වාර්ෂික දල උෂ්ණත්වය – 26.8ºC
(මූලාශ්‍රය: https://weatherandclimate.com )

**2.5** ප්‍රදේශයේ ජන විකාශන ලක්ෂණය

ග්‍රාම නිලධාරිනී ඒ.ඒ.ජී. චතුරානි මහත්මියගේ තොරතුරු අනුව, ස්ථාන අංක 228 අඹේවෙල 447A ග්‍රාම නිලධාරි වසමට අයත් වන අතර, එහි සමස්ත ජනගහනය 729කි (කාන්තා – 367; පිරිමි – 362).

## 3. සිදුවූ නායයෑම් උපද්‍රව පිළිබඳ තොරතුරු

**3.1** නායයෑම් ආපදාවේ ස්වභාවය

මෙම ස්ථානවල සිදු වූ ආසන්නතම නායයෑම් සිදුවීම 2025 නොවැම්බර් මස 29 වන දින තුළ වාර්තා වූ අතර, එය "දිත්වා" සුළි කුණාටුව සමඟ සමගාමීව සිදුවිය. මෙම සිදුවීමේදී මෙම ස්ථානයේ පස් සහ පාංශු කොටස් බෑවුම දිගේ පහළට ගමන් කිරීම නිසා දුම්රිය මාර්ගයට යටින් පැවති ආධාරක පස සෝදාගෙන ගොස් හානියට වූ රටාවක් දැකගත හැකි වූ අතර මතුපිට විශාල ලෙස ජල ගලායාම සහ සුන්බුන් ගලායාම හේතුවෙන් දෙපස කෙළවරෙහි පිහිටි කාණු දෙක දැඩි ලෙස හානි වී තිබුණි.

*(වැඩි දුර අධ්‍යනය සඳහා රූපය 4: හරස් කඩ, ඉඩම් භාවිතය, අවදානම් අංග සහ ස්ථානයේ විශේෂ ලක්ෂණවල ඡායාරූප)*

**3.2** නායයෑමෙන් සිදුව ඇති බලපෑම හා ප්‍රතිවිපාක

දිට්වා සුළි කුණාටුව ගමන් කළ කාලය තුළ නායයෑම්, බෑම් කඩාවැටීම් සහ බෑවුම් කඩාවැටීම් හේතුවෙන් දුම්රිය යටිතල පහසුකම් සහ දර්ශනීය නැරඹුම් ස්ථානවලට දැඩි හානි සිදුවිය. ඉන් ඇති වූ ආර්ථික විස්ථාපනය සහ බාධා

කිරීම්, හානි වූ දුම්රිය වේදිකාව ඔස්සේ ප්‍රවේශ්‍යතාවට සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කළේය. ඉදිකිරීම් හානි හා බිම් කඩා වැටීම් නිසා, මෙම වත්කම් යථා තත්ත්වයට පත් කිරීමට පළපුරුදු විශේෂඥයින්ගේ සහාය අත්‍යවශ්‍ය වේ.

තවද, නායයෑම් සහ පාංශු චලනයන් හේතුවෙන් දුම්රිය මාර්ග අවහිර වී හා හානියට පත්ව ඇති අතර, එමඟින් ආරක්ෂාව සහ ප්‍රවාහන කටයුතු තවදුරටත් අවදානමට ලක් වී ඇත. පාරිසරික, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් ඉතාමත් වටිනා ශාක විශේෂ, එනම් *Rhododendron arboretum* (මහ-රතමල්), පයිනස් විශේෂය (පයින් ශාකය) සහ ටර්පන්ටයින් ඇතුළු ශාකසම්පත්, දරුණු කුණාටු තත්ත්වයන් හේතුවෙන් සම්පූර්ණයෙන් විනාශ විය.

නානු ඔය සහ අඹේවෙල අතර දුම්රිය මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවා ඇතත්, බදුල්ල සිට අඹේවෙල දක්වා දුම්රිය සේවා අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම කාල සීමාව තුළ දිනකට දුම්රිය ධාවන වාර ගණන් පෙර පැවති මට්ටම්වලට සාපේක්ෂව දළ වශයෙන් 50 දක්වා ඉහළ ගොස් ඇත.

### **3.3** පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2025 දෙසැම්බර් මස 28 වන දින කොටගල - අඹේවෙල කොටස අතර පිහිටි උඩරට දුම්රිය මාර්ගය ආශ්‍රිතව ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර පරීක්ෂණ වාර්තාවක් නිකුත් කරන ලදී. මෙම පරීක්ෂාවේ අරමුණ වූයේ බෑවුම් අස්ථායීතාව හේතුවෙන් ඇති වූ බලපෑම් පිළිබඳ මූලික ඇගයීමක් සිදු කිරීම, පවතින ස්ථානීය තත්ත්වයන් ඇගයීම හා පරිශීලක ආරක්ෂාව තහවුරු කරමින් දුම්රිය මාර්ගය කඩිනම් ප්‍රවාහන කටයුතු සඳහා නැවත විවෘත කිරීම පිළිබඳ තාක්ෂණික උපදෙස් ලබාදීම සහ දිගුකාලීන අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍යතා හඳුනා ගැනීමයි.

දුම්රිය මාර්ගය විනාශ වීමත් සමඟ සියලු දුම්රිය ප්‍රවාහනය අත්හිටුවන ලදී. එබැවින් එම ප්‍රදේශයේ විය හැකි අවදානම අඩු කිරීම සඳහා වෙනත් කිසිදු බෑවුම් පිළියම් කිරීමේ ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කරනු නොලැබිණි.

### **3.4** ඉවත් කිරීම්

මෙම ස්ථානය සඳහා ඉවත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

### **3.5** නැවත පදිංචි කිරීම ප්‍රගතිය

මෙම ස්ථානය සඳහා ව්‍යාපෘති පාදක කරගත් නැවත පදිංචි කිරීමේ වැඩසටහනක අවශ්‍යතාවයක් නොමැත.




*රූපය 4: ගූගල් රූපය, හරස් කඩ, ඉඩම් භාවිතය, අවදානම් අංග සහ ස්ථානයේ විශේෂ ලක්ෂණවල ඡායාරූප*

## 4. පාෂාණ කඩා වැටීම සිදුවන ප්‍රදේශය, ඊට යාබද ප්‍රදේශ සහ වර්තමාන අවදානම් මට්ටම පිළිබඳ තොරතුරු

**4.1** නායයෑමේ ප්‍රදේශය

ශ්‍රී ලංකාවේ දුම්රිය පද්ධතිය ප්‍රථමයෙන් හඳුන්වා දෙනු ලැබුවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වන අතර, ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය කිරීම එහි අරමුණ විය. දුම්රිය දෙපාර්තමේන්තුව මීට සියවසකටත් අධිකට පමණ පෙර, එනම් 1858 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකාවේ දුම්රිය ජාලය ප්‍රධාන මාර්ග නවයකින් සමන්විත වන අතර, එහි සමස්ත දිග ආසන්න වශයෙන් කිලෝමීටර් 1,508කි. මෙම ප්‍රධාන දුම්රිය ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියර කිහිපයකින් සිදුකර ඇති අතර, ඒවා කොළඹ සිට අඹේපුස්ස (1864), අඹේපුස්ස සිට මහනුවර (1867), පේරාදෙණිය සිට නාවලපිටිය (1874), නාවලපිටිය සිට නානුඔය (1885), නානුඔය සිට බණ්ඩාරවෙල (1894), සහ බණ්ඩාරවෙල සිට බදුල්ල (1924) දක්වා විය. මීට අමතරව, පේරාදෙණිය සිට මහනුවර දක්වා මාර්ගය පසුව 1880 දී මාතලේ දක්වා දීර්ඝ කරන ලද අතර, එමඟින් රටේ මධ්‍යම ප්‍රදේශයට දුම්රිය ජාලය තවදුරටත් ව්‍යාප්ත විය.

දුම්රිය ජාලයේ ප්‍රධාන මාර්ගය ලෙස හඳුන්වන උඩරට  දුම්රිය මාර්ගය පේරාදෙණිය හරහා රඹුක්කන සිට බදුල්ල දක්වා සුන්දර ග්‍රාමීය පරිසරයක් ඔස්සේ ගමන් කරයි. උතුරු මාර්ගය සහ මාතලේ මාර්ගය පිළිවෙළින් පොල්ගහවෙල සහ පේරාදෙණිය ප්‍රදේශවලදී ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වේ. මෙම දුම්රිය කොටස පහත් බිම් ප්‍රදේශ සහ මධ්‍යම කඳුකර ප්‍රදේශ අතර වැදගත් සම්බන්ධකයක් ලෙස ක්‍රියා කරන අතර, ගම්මාන, වගාබිම්, ගංගා, දැඩි බෑවුම් සහ කඳුකර භූමි හරහා මගීන් ප්‍රවාහනය කරනු ලබයි.

දුම්රිය මාර්ගය ශක්තිමත් පාෂාණ ස්ථර කපා ඉදිකර ඇති බැවින්, රඹුක්කන සිට බදුල්ල දක්වා ප්‍රධාන මාර්ගය තුළ උමං මාර්ග 46ක් පවතී. මෙම මාර්ගයේ රඹුක්කන සිට බදුල්ල දක්වා සමස්ත දුර ආසන්න වශයෙන් කිලෝමීටර් 208කි. සාමාන්‍යයෙන් දිනකට මගීන් 100,000කට ආසන්න සංඛ්‍යාවක් මෙම මාර්ගය භාවිත කරන අතර, එය රටේ වැඩිම භාවිතයක් ඇති දුම්රිය කොරිඩෝරයන්ගෙන් එකකි.

මෙම දුම්රිය මාර්ගය මධ්‍යම කඳුකර ප්‍රදේශය වෙත ගමන් කරන ජනතාවට පහසු සහ අඩු වියදම් ප්‍රවාහන ක්‍රමයක් ලෙස තවමත් පවතී. එබැවින්, මෙය ප්‍රවාහන මාර්ගයක් පමණක් නොව ජනතාව, ස්ථාන සහ ආර්ථික අවස්ථා එකිනෙකට සම්බන්ධ කරන වැදගත් මහජන සේවාවක් ද වේ.

කෙසේ වෙතත්, දිත්වා සුළි කුණාටුව හේතුවෙන් පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාව මුහුණදුන් විශාලතම ගංවතුර සහ නායයෑම් හානි තත්ත්වය ඇති වූ අතර, රටේ දිස්ත්‍රික්ක 25ම පුරා ජනතාව මිලියන 2.2කට පමණ බලපෑම් එල්ල වී ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්තා අනුව, 2025 දෙසැම්බර් 29 වන විට පුද්ගලයන් 638 දෙනෙකු මියගොස් ඇති අතර තවත් පුද්ගලයන් 175 දෙනෙකු අතුරුදන් වී ඇත. (2025 දෙසැම්බර් 28 වැනි දින පෙරවරු 09.00 වන විට පවතින ආපදා කළමනාකරණ තත්ත්ව වාර්තාවට අනුව).

දිත්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ අධික වර්ෂාපතනය සහ නායයෑම් නිසා දුම්රිය පද්ධතියට විශාල හානි සිදුවී ඇත. සංඥා පද්ධති බිඳවැටී ඇති අතර, දැඩි ඛාදනය සහ බෑවුම් කඩාවැටීම් හේතුවෙන් දුම්රිය මාර්ග කොටස් විනාශ වී ඇත. දුම්රිය පාලම් කිහිපයක් කඩා වැටී ඇති අතර, දුම්රිය ස්ථාන කිහිපයක් ද නායයෑම් හේතුවෙන් බලපෑමට ලක් වී ඇත. මීට අමතරව, උඩරට  දුම්රිය මාර්ගයේ උමං මාර්ගද හානියට පත්ව ඇත. මෙම විනාශකාරී කාලගුණ තත්ත්වය හේතුවෙන් දුම්රිය ජාලයෙන් සියයට 30ක් පමණ තාවකාලිකව අක්‍රිය වී ඇත. අඹේවල දුම්රිය ස්ථානයට ආසන්න දුම්රිය කොටස ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රධාන දුම්රිය මාර්ගයේ ඉතා වටිනා සහ වැදගත් කොටසක් නියෝජනය කරයි. කෙසේ වෙතත්, මෙම කොටසට සිදුව ඇති දැඩි හානිය හේතුවෙන් සමාජීය, පාරිසරික, ආර්ථික, සෞන්දර්යාත්මක සහ භූගෝලීය වශයෙන් සැලකිය යුතු බලපෑම් ඇති වී ඇති අතර, එය ප්‍රවාහනයට පමණක් නොව ප්‍රදේශයේ ජනජීවිතයට සහ සමස්ත සංවර්ධනයටද දැඩි අභියෝග මතුකර ඇත.

අවම කිරීමේ ස්ථානයට ආසන්නයේ හැර වෙනත් ප්‍රදේශවල නිවාස නිරීක්ෂණය නොවීය. විස්ථාපනය වූ පස් ස්කන්ධ සහ හානියට පත් වෘක්ෂලතා දුම්රිය රක්ෂිත ප්‍රදේශ සහ වන රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව එක්රැස් වී තිබුණි. බලපෑමට ලක් වූ ප්‍රදේශයේ භූමිය ප්‍රධාන වශයෙන් ටර්පන්ටයින්, පයිනස් සහ මහා-රත්මල් වලින් සමන්විත වේ.

*(වැඩි දුර අධ්‍යනය සඳහා රූපය 2:  අවම කිරීම සඳහා යෝජිත ස්ථානවල භූ ආකෘති  විද්‍යාත්මක සහ පාරිසරික ලක්ෂණ පිළිබඳ නිරීක්ෂණ)*

වගුව 1: අවම කිරීම සඳහා යෝජිත ස්ථානවල භූ ආකෘති විද්‍යාත්මක සහ පාරිසරික ලක්ෂණ පිළිබඳ නිරීක්ෂණ

| ස්ථානීය අංක | ස්ථානය | නිරීක්ෂණය කළ අංග | භූ අකෘති විද්‍යාත්මක සහ පාරිසරික ලක්ෂණ පිළිබඳ නිරීක්ෂණ |
|---|---|---|---|
| 228 | CH 134/78 |  | • පාලනයකින් තොර මතුපිට ජල ගලායාම හේතුවෙන් පහළ බෑවුම දිශාවට වන්නට වූ දුම්රිය මාර්ගයේ ඉහළ කොටස ඛාදනය වී තිබුණි.<br>• දැඩි මතුපිට ජල ගලායාම හේතුවෙන් බෝක්කුව සම්පූර්ණයෙන්ම හානියට පත්ව තිබුණි. |

**4.2** පාෂාණ කඩා වැටීමේ ප්‍රදේශයට යාබද ප්‍රදේශය

අඹේවෙල ආසන්නයේ දුම්රිය මාර්ග කොටස භූගෝලීය වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් නිරූපණය කරනු ලබයි. එය තණබිම් සහිත භූ දර්ශනවලින් සමන්විත සංචාරකයින් ආකර්ෂණය වන දර්ශනීය පරිසරයක් නිරූපණය කරන අතර, උඩරට ප්‍රදේශයේ ප්‍රසිද්ධ අඹේවෙල කිරි ගොවිපළද එම ප්‍රදේශය තුළ පිහිටා ඇත. උඩරට දුම්රිය මාර්ගයේ ආරම්භක කොටස සාපේක්ෂව සමතලා භූමියකි. පසුව, දුම්රිය මාර්ගය ක්‍රමයෙන් වඩාත් දුෂ්කර භූමි ප්‍රදේශයක් තුළ ඉහළට නැගී යාම ආරම්භ වේ.මෙම භූගෝලීය සැකැස්ම නිසා දුම්රිය මාර්ගය උපායමාර්ගික වැදගත්කමක් දරන අතර, අභ්‍යන්තර කඳුකර ප්‍රදේශ වෙත ප්‍රවේශය සලසන ප්‍රධාන මාර්ගයක් ලෙස ක්‍රියා කරයි. එහෙත්, එම භූමි ස්වභාවයම නායයෑම්, බෑවුම් කඩාවැටීම් සහ අධික වර්ෂාපතනය වැනි ස්වාභාවික අවදානම් සඳහා ඉතා සංවේදී තත්ත්වයක්ද ඇති කරයි. වංගු සහිත මාර්ග සැලැස්ම, දැඩි බෑවුම් සහ අස්ථායි භූමිය හේතුවෙන් අඛණ්ඩ ඉංජිනේරු අවධානය සහ නඩත්තු කටයුතු අත්‍යවශ්‍ය වේ. මෙම භූගෝලීය අභියෝග නිසා, දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම තැනිතලා වෙරළබඩ කලාපයක දුම්රිය මාර්ගයක් අලුත්වැඩියා කිරීමට වඩා බෙහෙවින් දුෂ්කර වන අතරම මෙම භූගෝලීය පිහිටීමම දුම්රිය මාර්ගයට සුවිශේෂත්වයක් සහ වැදගත්කමක් ලබා දීමට සමත් වී ඇත. එමෙන්ම එය වෙනත් ආකාරයකින් ප්‍රවේශය ලබා ගැනීම වඩාත් දුෂ්කර හා වියදම්කාරී වන භූමි ප්‍රදේශ හරහා ගමන් කරන අත්‍යවශ්‍ය ප්‍රවාහන මාර්ගයක් ලෙස ක්‍රියා කරනු ලබයි.

නානු ඔය සිට අඹේවෙල දක්වා දුම්රිය මාර්ගයට සිදුවූ හානි යනු සරල ප්‍රවාහන බාධාවකට වඩා පුළුල් බලපෑමක් ඇති ගැටලුවකි. මෙය ජනතාවගේ දෛනික ජීවිතයට සමාජමය බලපෑම්, වෙළඳාම සහ සංචාරක කර්මාන්තයට ආර්ථිකමය බලපෑම්, අස්ථායි කඳුකර භූ දර්ශනවලට සිදුවූ පාරිසරික බලපෑම්, භූමි ප්‍රදේශයේ දුෂ්කරතාවය හේතුවෙන් භූගෝලීය ප්‍රතිඵල, මෙන්ම ශ්‍රී ලංකාවේ අතිශය සුන්දර දුම්රිය ගමන් මාර්ගයක සෞන්දර්යාත්මක වටිනාකමටද බලපෑම් ඇති කරනු ලබයි. එබැවින්, මෙම දුම්රිය මාර්ග කොටස රටේ ප්‍රවාහන ජාලයේ වැදගත් අංගයක් වන අතරම සංස්කෘතික හා ස්වාභාවික උරුමයේද අත්‍යවශ්‍ය කොටසක් වේ. ඒ අනුව, මෙම ස්ථාන ආශ්‍රිත අවදානම් අවම කිරීම අත්‍යවශ්‍ය වේ.

ස්ථාන අංක 228, අඹේවෙල දුම්රිය ස්ථානයෙන් මීටර් කිහිපයක් පමණ දුරින් පිහිටා ඇති අතර, මෙම ස්ථානයේ ඉහළ බෑවුම සහ පහළ බෑවුම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සැලකිල්ලට ගෙන ඇත. තවද, මෙම හානිය අවම කිරීමේ ස්ථානය කන්දේ ඇළ රක්ෂිතය තුළ පිහිටා ඇත.
*(වැඩි දුර අධ්‍යනය සඳහා රූපය 4: ගූගල් රූපය ,හරස් කඩ, ඉඩම් භාවිතය, අවදානම් අංග සහ ස්ථානයේ විශේෂ ලක්ෂණවල ඡායාරූප)*

**4.3** වර්තමාන අවදානම් ස්වභාවය

මෙම ස්ථානවල දුම්රිය මාර්ගයේ ඉහළ ප්‍රදේශවල ඇති නායයෑම් තත්ත්වයන්, කොළඹ කොටුව සිට බදුල්ල දක්වා උඩරට දුම්රිය මාර්ගයේ අඛණ්ඩ දුම්රිය සේවා ක්‍රියාකාරිත්වයට දැඩි අවදානමක් මතු කරනු ලබන අතර එමඟින් සේවා බාධා සහ මාර්ග අවහිරතා ඇතිවීමේ හැකියාවද ඉහළ යයි.එසේම, ප්‍රවේශය සීමා වීම හේතුවෙන් අත්‍යවශ්‍ය සේවා, පහසුකම් සහ ආර්ථික ක්‍රියාකාරකම් මෙන්ම දෛනික ගනුදෙනු සහ වෙළඳ කටයුතු කෙරෙහි බරපතළ ලෙස බාධා විය හැක.

## 5. ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත පිළිසකර කිරීමේ ක්‍රියාමාර්ගයන්

අඹේවෙල ප්‍රදේශයේ දුම්රිය ප්‍රධාන මාර්ගය 1957 දී බෑවුම් බිඳවැටීම් හේතුවෙන් බලපෑමට ලක් වූ අතර එය ප්‍රතිසංස්කරණය කරන ලදී. දිත්වා සුළි කුණාටුව ඇති වූ කාලය තුළ අවම කිරීමේ ස්ථාන අංක 228 හි නාය යාම් සිදු වූ අතර, ඒ හේතුවෙන් මරණ හා තුවාල ඇති විය. එමගින් එම මාර්ග කොටස මාස කිහිපයක් පුරා ගමන් කළ නොහැකි තත්ත්වයට පත් වීම හේතුවෙන් මහජන සේවා, ආපදා සෙවීම් හා සහන කටයුතු මෙන්ම ජාතික ආර්ථිකයද දැඩි ලෙස අහිතකර ලෙස බලපෑමට ලක් විය.මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ බෑවුම් ස්ථායීකරණ

විසඳුම් ක්‍රියාත්මක කිරීම මඟින් නැවත නැවත සිදුවන බාධා අවම කර, අඹේවෙල සිට නානුඔය දක්වා වන දුම්රිය මාර්ග කොටස තුළ ආරක්ෂිත ප්‍රවාහනය සහතික කිරීමයි.

මෙම අවදානම් අවම කිරීම සඳහා තෝරාගෙන ඇති ස්ථාන නායයෑම් සිදුවීමේ ඉහළ හැකියාවක් ඇති ස්ථාන ලෙස හඳුනාගෙන ඇති අතර, යෝජිත ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ඉදිරියේදී ඇතිවිය හැකි නායයෑම් තවදුරටත් වර්ධනය වීම වැළැක්වීමයි. ඒ අනුව, ගේබියන් බිත්ති , ගල් පිරවීම සහ මතුපිට සහ භූගත ජල බැසයාමේ පද්ධති වැඩිදියුණු කිරීම වැනි ආරක්ෂක පියවර ක්‍රියාත්මක කරනු ඇත.

*(වැඩි දුර අධ්‍යනය සඳහා රූපය 3: ගල් කඩා වැටීම් / නායයෑම් අවදානම අවම කිරීම සඳහා අවම කිරීමේ ස්ථාන ආශ්‍රිතව නිර්දේශිත ක්‍රියාමාර්ග වෙත යොමු වන්න.)*

වගුව 2: ගල් කඩා වැටීම් / නායයෑම් අවදානම අවම කිරීම සඳහා අවම කිරීමේ ස්ථාන ආශ්‍රිතව නිර්දේශිත ක්‍රියාමාර්ග

| ස්ථාන අංක | ස්ථානය | මූලික සමීක්ෂණවලින් ලබාගත් නිර්දේශ | යෝජිත අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| 228 | CH 134/78 | • කඩිනම් ක්‍රියාමාර්ගයක් ලෙස, වර්ෂා ජලය නිසි දිශාවකට හරවා යැවීම සඳහා මාර්ග අද්දර මතුපිට ජලාපවහන සහ තිරස් ජලාපවහන පද්ධතියක් ඉදිකිරීම නිර්දේශ කරනු ලැබේ.<br>• අවහිර වූ කාණු තුළ ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම | • ශක්තිමත් කිරීමේ බැම්ම - RCL (ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් එසවීම/කැන්ටිලිවර්) බිත්ති<br>• මතුපිට සහ උපමතුපිට කාණු |

## 6. ව්‍යාපෘති ක්‍රියාවන් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී ඒකක සහ හානි වූ ඒකක පිළිබඳ විශේෂ සඳහනක් සහිත අවට පරිසරය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවදානමට ලක්ව ඇති කොටස් සහ සේවාවන් නම්;

i. අවදානම් අවම කිරීමේ ස්ථාන ආසන්නයේ පවතින නිවාස ආශ්‍රිත ක්‍රියාකාරකම් (ආසන්න නිවාස වෙත ප්‍රවේශ මාර්ග සහ ඒවාට අදාළ වගා කටයුතු)

ii. ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ (මහ රත්මල් – *Rhododendron arboreum*)

*(වැඩි දුර අධ්‍යනය සඳහා රූපය.5 ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී ඒකක සහ හානි වූ ඒකක බලන්න)*



*රූපය 5a: නානුඔය සිට අඹේවෙල දුම්රිය ස්ථානය දක්වා දුම්රිය මාර්ගය සෝදා ගොස්ඇත. ස්ථාන අංක: 228 (CH 134/78)*



*රූපය 5b: ටර්පන්ටයින්, පයිනස් සහ මහා-රත්මල් වෘක්ෂලතාදිය සහිත ඉහළ බෑවුම ආසන්නයේ පිහිටි අවම කිරීමේ ස්ථානය*



*රූපය 5c: මගීන් සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙස භාවිතා කරනු ලබන සෝදා ගොස් ඇති ලද දුම්රිය මාර්ගය සහ වෘක්ෂලතාදිය*



*රූපය 5d: ඉහළ බෑවුම් වනාන්තර ප්‍රදේශය මහා-රත්මල් වැනි ආවේණික ශාක වලින් සමන්විත වේ*



*රූපය 5e: මහා-රත්මල්, ටර්පන්ටයින් සහ අනෙකුත් පඳුරු සහිත පහළ බෑවුමෙහි වෘක්ෂලතාදිය*



*රූපය 5f: හානියට පත් පහල බෑවුමේ ඇති මහා-රත්මල් ශාඛ*



*රූපය 5g: සුන්බුන් වලින් අවහිර වී ඇති ආසන්නයේ පිහිටි බෝක්කුව*



*රූපය 5h: ඉහළ බෑවුමෙහි පිහිටි ජල උල්පත්*



*රූපය 5i: ස්ථානයේ පහළ බෑවුම් ප්‍රදේශය වෘක්ෂලතා ආවරණයෙන් යුක්ත වන අතර, කාණු හරහා උල්පත් ජලය ගලා එමින් මෙම ප්‍රදේශය තෙත් සහ මඩ භූමියක් බවට පත් වී ඇත.*

*රූපය 5: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි අංග සහ සේවාවන් මෙන්ම හානි විය හැකි අංග*

## 7. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම

### 7.1 හිතකර බලපෑම්

• මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ නානු ඔය සහ අඹේවෙල දුම්රිය ස්ථාන අතර අස්ථායී භූමි කොටස්වල පවතින අවදානම පිළිගත හැකි මට්ටමකට අවම කිරීමයි. මෙම ස්ථාන ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගමනාගමන මාර්ගයක් වන උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටා ඇති අතර, එය දිවයිනේ ප්‍රධාන ගමනාන්ත රැසක් සම්බන්ධ කරයි. මෙම මාර්ගය කොළඹ සහ බදුල්ල දිස්ත්‍රික්කය අතර ප්‍රධාන දුම්රිය සම්බන්ධතාවය වන අතර, ගම්පහ, කෑගල්ල, මහනුවර සහ නුවරඑළිය හරහා ගමන් කරමින් දෛනික ප්‍රවාහනය, සංචාරක කර්මාන්තය සහ කලාපීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වැදගත් දායකත්වයක් සපයයි.

• උඩරට දුම්රිය මාර්ගය ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශ, විශේෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කය, සමඟ දුම්රිය සම්බන්ධතා ශක්තිමත් කරනු ලබයි. අඹේවෙල සහ නානුඔය දුම්රිය ස්ථාන, අඹේවෙල නවසීලන්ත ගොවිපළ, කන්දේ ඇළ ජලාශය සහ ශ්‍රී පාදස්ථානය වැනි ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථාන වෙත පිවිසුම් ද්වාර ලෙස ක්‍රියා කරනු ලැබේ. තවද, ස්වර්ණගිරි මහා විහාරය සහ හක්ගල උද්භිද උද්‍යානය වැනි සංස්කෘතික හා ස්වාභාවික වටිනාකමකින් යුත් ස්ථානද නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹේවෙල දුම්රිය ස්ථානය ආසන්නයේ පිහිටා ඇත. එබැවින්, මෙම දුම්රිය මාර්ග කොටස සංචාරක, ආගමික සහ ප්‍රාදේශීය ආර්ථික කටයුතු සඳහා සැලකිය යුතු වැදගත්කමක් දරයි. යෝජිත ව්‍යාපෘතිය මඟින් නායයෑම් අවදානම අවම කරමින්, වසර පුරා දුම්රිය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සහ මඟී ආරක්ෂාව වැඩිදියුණු කිරීම තුළින් සේවා විශ්වාසනීයත්වය ඉහළ නංවනු ඇත.

• මෙම අවම කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් ප්‍රදේශයේ සංචාරක කටයුතු සහ ජනතාවගේ අනෙකුත් අත්‍යවශ්‍ය ජීවනෝපාය ක්‍රියාකාරකම් විශාල වශයෙන් ප්‍රතිලාභ ලබනු ඇත.

### 7.2 අහිතකර බලපෑම්

හානිය අවම කිරීමේ කටයුතු එම පාෂාණ පතනය වන භූමි ප්‍රදේශය තුලට පමණක් සීමා වේ. එබැවින් ඍණාත්මක බලපෑම් එම ස්ථානයට පමණක් බොහෝ විට සීමා වනු ඇති අතර ඉදිකිරීම් කාලයට පමණක් සීමා වේ.*(වැඩිදුර අධ්‍යනය සඳහා වගුව 4: ඍණාත්මක බලපෑම් හා ඒවා වැදගත් වන මට්ටම බලන්න )*

වගුව 3: සෘණාත්මක බලපෑම් හා ඒවා වැදගත් වන මට්ටම

| **ඉදිකිරීම් කාලය තුළ විය හැකි බලපෑම් නිර්ණායක** | **බලපෑම් මට්ටම** |
|---|---|
| **7.2.1 ජල විද්‍යාත්මක බලපෑම්** | |
| **7.2.1.1** ප්‍රදේශයේ ජලාපවහන රටාව කෙරෙහි බලපෑම<br>ව්‍යාපෘති සැලසුම්වල බහුතරයක් මතුපිට සහ භූගත ජලාපවහන කළමනාකරණය සැලකිල්ලට ගෙන සකස් කර ඇති අතර, එමඟින් මතුපිට ජලය සහ භූගත ජලය ඉවත් කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව, වැසි සමයේදී විශාල ජල ප්‍රවාහයක් ජනනය වීමට අපේක්ෂා කෙරේ. භූගත ජල මට්ටම පහළ යාම සහ භූගත ජල ගබඩා ධාරිතාව අඩුවීම හේතුවෙන් ප්‍රාදේශීය මට්ටමේ බලපෑම් ඇති විය හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇළ මාර්ග වියළී යා හැකිය. එබැවින්, වියළි කාලවලදී ප්‍රජාව ජල හිඟයකට මුහුණ දීමට ඉඩ ඇති අතර, මෙය ව්‍යාපෘතියට සැලකිය යුතු අහිතකර බලපෑමක් ලෙස සැලකේ.<br>කෙසේ වෙතත්, වැසි සමයේදී ඇළ මාර්ග වෙත ගලා යන ජල ප්‍රමාණය ඉහළ යාමක් සිදුවනු ඇති අතර, මතුපිට ජලය සෘජුවම ඇළ මාර්ග වෙත හෝ බෝක්කු හරහා යොමු කළහොත් ඇළ පතුල සහ ඉවුරු ඛාදනයට ලක්වීම මෙන්ම බෝක්කු ආශ්‍රිත ඛාදනයද සිදුවිය හැකිය. ඒ හේතුවෙන්, මෙය ඉතා ඉහළ වැදගත්කමකින් යුත් බලපෑමක් ලෙස සැලකේ. | **අතිශයින් වැදගත්** |
| **7.2.1.2** ජල දූෂණය සම්බන්ධයෙන් ඇති බලපෑම<br>බෑවුම් කැණීම් කටයුතු අතරතුර, සුන්බුන් ඉවත් කිරීම හේතුවෙන් අවසාද බහුල ජල ප්‍රවාහයක් ජනනය විය හැකිය. අවම කිරීමේ ස්ථානය ආසන්නයේ ජල ප්‍රවාහයක් නොමැති බැවින්, ප්‍රදේශයේ පවතින අධික ජල කාන්දුවීම් තත්ත්වය යටතේ වුවද, දූෂිත මතුපිට ජල ගලායාම් හේතුවෙන් ආසන්න ජල ප්‍රවාහ දූෂණය වීමේ හැකියාව ඉතා අවම වේ. එමෙන්ම, යන්ත්‍රෝපකරණවලින් තෙල් සහ අනෙකුත් හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම, තාවකාලික ගබඩා ටැංකිවලින් කාන්දුවීම් සිදුවීම, ඝන අපද්‍රව්‍ය සහ අපජලය අනිසි ලෙස බැහැර කිරීම හෝ ගොඩ දැමීම හේතුවෙන් මතුපිට ජල ගලායාමේ ගුණාත්මකභාවයට අහිතකර බලපෑම් ඇති විය හැකිය. | **වැදගත්** |
| **7.2.1.3** ඛාදන බලපෑම් සහ ගංගාවන්හි පතුල වෙනස් වීම<br>ඉදිකිරීම් අදියරේදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බෑවුම මතුපිට ඛාදනයට විවෘත වනු ඇත. එමෙන්ම, ප්‍රදේශයේ පවතින මතුපිට සහ භූගත ජලාපවහන රටාවන් හෝ හානියට පත් ජලාපවහන කානු ඉදිකිරීම් කටයුතු අතරතුර බාධාවට ලක්වනු ඇත. එබැවින්, ඛාදන බලපෑම් සැලකිය යුතු මට්ටමක පවතිනු ඇත. | **වැදගත්** |
| **7.2.1.4** අක්‍රමවත් වැසිකිලි භාවිතය නිසා ජලයෙන් පැතිරිය හැකි ආසාධන<br>ප්‍රධාන දුම්රිය මාර්ගයට අයත් මෙම ස්ථානය හානියට පත් දුම්රිය මාර්ගය අලුත්වැඩියා කරන තෙක් ක්‍රියාත්මක නොවන තත්ත්වයේ පවතී. එමෙන්ම, දුම්රිය මාර්ගය ආශ්‍රිත අවම කිරීමේ ස්ථානය අවට ප්‍රදේශය හුදකලා වන අතර වෘක්ෂලතා ආවරණයෙන් යුක්ත බැවින්, විවෘත ස්ථානවල මළපහ කිරීමේ හැකියාව ඉහළ විය හැකිය. | **වැදගත්** |
| **7.2.1.5** පහළ ප්‍රදේශයේ ජල පරිභෝජකයන්ට ඇති විය හැකි බලපෑම්<br>ඉදිකිරීම් කටයුතු දුම්රිය මාර්ගයට ආසන්නයේ දැනටමත් බාධාවට ලක්ව ඇති බෑවුමක සිදු කෙරේ. පහළින් ඇති බෝක්කුව හරහා ආසන්න තෙත්බිම් ප්‍රදේශ වෙත ගලා යන මතුපිට ජල ගලායාම කිසිදු භාවිතයක් සඳහා යොදා නොගන්නා බැවින්, ජල භාවිතයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොවනු ඇත | **නොවැදගත්** |
| **7.2.1.6** භූගත ජල මට්ටමට හා භූගත ජලයේ ගුණාත්මකභාවයට විය හැකි<br>ඉදිකිරීම් කටයුතු අතරතුර සිමෙන්ති සහ ග්‍රවුට් ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍ය භූගත ජල ප්‍රවාහ සමඟ මිශ්‍ර වීම හේතුවෙන් ජලයේ ගුණාත්මකභාවය තාවකාලිකව පිරිහීමට ලක්විය හැකි අතර අනවශ්‍ය ද්‍රව්‍ය එකතු වීමද සිදුවිය හැකිය. තවද, ඉදිකිරීම් සමයේදී රසායනික ද්‍රව්‍යවලින් ජනිත වන අන්තරායකර අපද්‍රව්‍ය, ඉදිකිරීම් ක්‍රියාකාරකම්වලින් ඇතිවන අපජලය සහ ස්ථානීය සෙප්ටික් පද්ධතිවලින් බැහැර කරන ජලය හේතුවෙන් භූගත ජලයේ ගුණාත්මකභාවයට අහිතකර බලපෑම් ඇති විය හැකිය.<br>මීට අමතරව, බෑවුම් ප්‍රදේශයේ සිදුකරනු ලබන අවම කිරීමේ ක්‍රියාකාරකම් භූගත ජලයේ ගුණාත්මකභාවයට බලපෑම් කළ හැකි අතර, එමඟින් භූගත ජල මට්ටම පහළ යාමේ තත්ත්වයක්ද ඇති විය හැකිය. | **වැදගත්** |

| | |
|---|---|
| **7.2.1.7 ජලය හෝ තෙත් බිම් මත බලපෑම්**<br>යන්ත්‍රෝපකරණ සහ සේවක නවාතැන් ස්ථානවලින් තෙල්, රසායනික ද්‍රව්‍ය, ඝන අපද්‍රව්‍ය හෝ අපජලය අනිසි ලෙස බැහැර කිරීම මෙන්ම තාවකාලික ගබඩා ටැංකිවලින් කාන්දුවීම් සිදුවීම හේතුවෙන්, බෑවුමේ පාදමේ පිහිටි බෝක්කුව හරහා ගලා යන මතුපිට ජලය දූෂණයට ලක්විය හැකි අතර, එමඟින් ජලය බැහැර වන ස්ථානයේ ජල ගුණාත්මකභාවයට අහිතකර බලපෑම් ඇති විය හැකිය. | **වැදගත්** |
| **7.2.2 පාරිසරික බලපෑම්** | |
| **7.2.2.1** ශබ්දය හා කම්පන මගින් ඇති විය හැකි බලපෑම්<br>ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ භාවිතය හේතුවෙන් ශබ්ද සහ කම්පන ඇතිවීමට අපේක්ෂා කෙරේ. ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන අවම කිරීමේ ස්ථානය ග්‍රාමීය සහ හුදකලා ප්‍රදේශයක පිහිටා ඇති බැවින්, ශබ්ද හා කම්පන බලපෑම් විශාල ලෙස සැලකිය යුතු මට්ටමක නොමැත. | **නොවැදගත්** |
| **7.2.2.2** වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම<br>වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් ලෙස ඉඩම් එළිපෙහෙළි කිරීම, ඩීසල් එන්ජින් ක්‍රියාත්මක කිරීම, කඩා ඉවත් කිරීම් , ගිනි තැබීම, ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම, ප්‍රවාහනය, බැහැර කිරීම, ඉදිකිරීම් අපද්‍රව්‍ය සහ විෂ සහිත ද්‍රව්‍ය සමඟ වැඩ කිරීම වැනි ක්‍රියාවන් හැඳින්විය හැක . ඉදිකිරීම් කටුයුතු සඳහා භාවිතා වන කොන්ක්‍රීට්, සිමෙන්ති, ලී, ගල් සහ සිලිකා වලින්ද සාමාන්‍යයෙන් ඉහළ මට්ටමේ දූවිලි ජනනය කරනු ලබන අතර ඉදිකිරීම් අවධියේදී ජනනය වන දූවිලි හේතුවෙන් මගීන්ද බලපෑමට ලක් විය හැකිය. | **වැදගත්** |
| **7.2.2.3** ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු<br>ඝන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම; ව්‍යාපෘති ස්ථානය අවට ජනනය අපද්‍රව්‍ය, ආහාර අපද්‍රව්‍ය, ඉදිකිරීම් අපද්‍රව්‍ය වැනි විවිධ වර්ගවල අපද්‍රව්‍ය ගබඩා කිරීමට හෝ බැහැර කිරීමට කටයුතු කල හැකි අතර දුම්රිය පරිශ්‍රය තුළ සහ එහි අවට මෙවැනි අවිධිමත් කසළ තැන්පත් කිරීම සහ බැහැර කිරීම අසල්වැසි ප්‍රජාවට අපහසුතා ඇති කරයි. ඝන අපද්‍රව්‍ය මගින් ජලාපවහන මාර්ග අවහිර විය හැකි අතර එවිට ජලයෙන් බෝවන රෝග පතුරුවන ස්ථානයක් බවට පත් විය හැකිය. අපද්‍රව්‍ය මගින් පස දූෂණය විය හැකි අතර ඉදිකිරීම් කාලය තුළ නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවන්නේ නම් විවිධ පාරිසරික බලපෑම් ඇති විය හැකිය. | **වැදගත්** |
| **7.2.2.4** පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය භාවිතය<br>අවම කිරීමේ ස්ථාන අංක 01 ආසන්නයේ විශාල, කාලගුණික විපර්යාස වලට ලක් වූ පාෂාණ නොමැති බැවින්, පාෂාණ පුපුරුවා ඉවත් කිරීමේ අවශ්‍යතාවක් අපේක්ෂා නොකෙරේ. | **නොවැදගත්** |
| **7.2.3 ජීව විද්‍යාත්මක /පරිසර විද්‍යාත්මක බලපෑම** | |
| **7.2.3.1** සැලකිය යුතු වනජීවී වාසස්ථානවල බලපෑම්<br>ව්‍යාපෘති බලපෑම් ප්‍රදේශය තුළ දුම්රිය රක්ෂිත භූමිය තුළ පිහිටා ඇති කන්දේ ඇළ වනාන්තරය ඉහළ ජෛව විවිධත්වයකින් සහ ආවේණික ශාක හා සත්ව විශේෂවලින් සමන්විත වේ. එබැවින්, ඉදිකිරීම් කාලය තුළ වනජීවී වාසස්ථාන අස්ථාවර වී බාධා ඇති විය හැකිය. | **අතිශය වැදගත්** |
| **7.2.3.2** සත්ත්ව හා ශාක විශේෂ කෙරෙහි බලපෑම්<br>බෑවුම් ප්‍රදේශයේ පිහිටා ඇති මහා-රත්මල් (*Rhododendron arboreum*) වැනි ශාක ආවේණික විශේෂ ලෙස සැලකෙන අතර, ඒවා IUCN රතු ලැයිස්තුවේ අවම අවධානය යොමු කළ යුතු ලෙස වර්ගීකරණය කර ඇත. ඒ සමඟම, අවදානමට ආසන්න ලෙස IUCN ලැයිස්තුවේ සඳහන් වන දිවියා (*Panthera pardus*), සහ වැලි මුවා / මන්ටජැක් (*Muntiacus muntjak malabaricus*) වැනි සත්ත්ව විශේෂද මෙම ස්ථානය ආසන්නයේ දැකිය හැකිය.<br><br>එසේම, ශ්‍රී ලංකාවට ආවේණික දම්මුහුණු වඳුරා වැනි වානර විශේෂද මෙම ප්‍රදේශයේ වාසය කරයි. මේ අනුව, ඉදිකිරීම් කටයුතු අතරතුර ශාක හා සත්ත්ව විවිධත්වයට සැලකිය යුතු අහිතකර බලපෑම් ඇති වීමේ හැකියාව පවතී. | **අතිශය වැදගත්** |

| 7.2.4 සාමාජීය හා ආර්ථික බලපෑම් | |
|---|---|
| **7.2.4.1** ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල හෝ යාබදව පිහිටා ඇති කෘෂිකාර්මික බිම්<br>අවම කිරීම සඳහා යෝජිත ස්ථානයට ආසන්නව හෝ එම ප්‍රදේශය තුළ කිසිදු වගා කටයුත්තක් නොමැත. | නොවැදගත් |
| **7.2.4.2** කම්පන නිසා ගොඩනැගිලි වලට විය හැකි බලපෑම<br>අවම කිරීමේ ස්ථානය හුදකලා ස්වභාවයකින් යුක්ත බැවින්, ස්ථානය ආසන්නයේ දුම්රිය මාර්ගයට අසල්වැසි ලෙස කිසිදු ගොඩනැගිල්ලක් හෝ නිවාස නොමැත. එබැවින්, ඇති විය හැකි බලපෑම් ඉතා සුළු ලෙස සැලකේ. | නොවැදගත් |
| **7.2.4.3** භූමියට සහ අනාගත සංවර්ධන කටයුතුවලට ප්‍රවේශය අහිමි වීම<br>අවම කිරීමේ කටයුතු දුම්රිය රක්ෂිත භූමිය තුළ කේන්ද්‍රගතව සිදු කෙරෙන අතර, අවම කිරීම සඳහා යෝජිත ස්ථාන දුම්රිය රක්ෂිත භූමි සහ වන රක්ෂිත භූමි තුළ පිහිටා ඇත. ඒ අනුව, එම ඉඩම් හිමියන්ට තම ඉඩම් වෙත ප්‍රවේශය අහිමි වීම හෝ වටිනා භාවිතයන් අහිමි වීම හේතුවෙන් සැලකිය යුතු බලපෑම් ඇතිවිය හැකිය. | වැදගත් |
| **7.2.4.4** ජීවනෝපාය/ව්‍යාපාර සහ ආදායම් උපයන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම්<br>යෝජිත හානිය අවම කිරීමේ ප්‍රදේශයට ආසන්නව කිසිදු ආදායම් උපයන ව්‍යාපාරික ක්‍රියාකාරකම් නොමැත. | නොවැදගත් |
| **7.2.4.5** සේවා සැපයීම කෙරෙහි ඇති වන බලපෑම (ජල සැපයුම, අපජලය, විදුලිය)<br>අස්ථායී බෑවුමෙන් ඉහළ දිශාවට කිසිදු විදුලි රැහැන් හෝ ජල සැපයුම් නල ගමන් නොකරන බැවින්, ඉදිකිරීම් කාලය තුළ තවදුරටත් බෑවුම් චලනයක් සිදු වුවද ඒවාට අවදානමක් ඇති නොවේ. | වැදගත් |
| **7.2.4.6** යටිතල පහසුකම් සහ ආරක්ෂාව අහිමි වීම හේතුවෙන් ඇති වන බලපෑම<br>ඉදිකිරීම් කාලය තුළ යන්ත්‍රෝපකරණ, ලෝඩර් සහ ට්‍රක් රථ වැනි වාහන නිතර ගමන් කිරීම හේතුවෙන් දුම්රිය මාර්ගයට බාධා ඇති විය හැකිය. ප්‍රධාන දුම්රිය මාර්ගය දැනටමත් හානි වී ඇති නමුත්, අඹේවෙල දුම්රිය ස්ථානය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. එසේ වුවද, ද්‍රව්‍ය ප්‍රවාහනය දියතලාව, හපුතලේ සහ නානුඔය ප්‍රදේශ හරහා සිදු වන බැවින්, දුම්රිය මාර්ගයට සෘජු බාධා ඇති නොවේ. | නොවැදගත් |
| **7.2.4.7** කඳවුරු සහ ව්‍යාපෘති භූමිය ස්ථානගත කිරීමේ අවශ්‍යතා<br>කඳවුරු භූමිය තෝරා ගනු ලබන්නේ ප්‍රජාවගේ අසල්වැසි ප්‍රදේශයෙන් වන බැවින් නිසි කඳවුරු කළමනාකරණයක් නොමැති නම්, එය කම්කරු ගැටලු , ප්‍රජාව සමඟ සමාජ ගැටලු, ප්‍රජාව සමඟ පොදු සම්පත් සඳහා ගැටුම්, අපහසුතා, සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි ගැටලු රැසක් ඇති කිරීමට හේතු විය හැකිය. තාවකාලික කඳවුරු ඉදිකිරීම් ස්ථා නයට ආසන්නයේ පිහිටුවන්නේ නම්, ඝන අපද්‍රව්‍ය සහ මලාපවහන කළමනාකරණය ගැටලුවක් වනු ඇත. | වැදගත් |
| **7.2.4.8** සහ කාර්ය මණ්ඩලය / ව්‍යාපෘති භූමිය අවට ජීවත් වන පුද්ගලයින් අතර සබඳතා සහ ආරවුල් ඇතිවීමේ හැකියාව<br>මෙම ස්ථානයේ ඉදිකිරීම් සිදු කරනු ලබන කම්කරුවන් විවිධ සමාජ පසුබිම හා දරිද්‍රතාවයන්ට යටත්ව විවිධ ප්‍රදේශ වල සිට පැමිණෙන පිරිස් වනු අත. සාමාන්‍යයෙන් ඔවුන් සිටින්නේ දුර්වල අධ්‍යාපනික හා සමාජ පසුබිමක ය එවැනි ප්‍රජාවන්ට අසල්වැසි ප්‍රජාව සමඟ ආතතියක් සහ බලපෑම් ඇති කරනු ලබන පුළුල් පරාසයක සමාජ ගැටලු තිබිය හැකිය.එවැනි ගැටළු වලට සම්බන්ධ වන සේවකයින් දුර්ලභ විය හැකි නමුත් , කුඩා සිදුවීමක් පවා නොසලකා හැරිය නොහැක | අතිශයින් වැදගත් |
| **7.2.4.9** ඉදිකිරීම් කටයුතු වලදී සේවකයන්ගේ ආරක්ෂාව<br>දුම්රිය සේවය තාවකාලිකව නවතා ඇති බැවින්, කම්කරුවන්ට දුම්රිය ගමනාගමනය හේතුවෙන් ඇතිවිය හැකි අනතුරු අවදානමට නිරාවරණය වීමේ හැකියාව අඩුය. ඉදිකිරීම් කටයුතු ඉතා සීමිත ඉඩක් තුළ සිදු කෙරෙන බැවින් අස්ථායී බෑවුමකින් බිමට පතිත වීමේ අවදානමකට ද ඔවුන් මුහුණ දිය හැකිය. තවද බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සීමිත වැඩ අවකාශයන් තුළ භාවිතා කළ හැකි බැවින් වාහන හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ වලින් අනතුරු විය හැකි අවදානම මෙම ස්ථානයේදී අතිශයින් වැදගත් වේ. ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු විසින් බාල වයස්කාර සේවකයින් (ළමුන්) යෙදවිය හැකි අතර, එය අවදානම් සහ බරපතල අනතුරු සහ තුවාල වලට හේතු විය හැක. | අතිශයින් වැදගත් |

| | |
|---|---|
| **7.2.4.10** ඉදිකිරීම් කටයුතු මගින් මහජනතාවට ඇතිවන ආරක්ෂාව: මගීන් සඳහා පවතින ඉහළ අවදානම<br><br>දුම්රිය මාර්ගයක් සහිත භූමි කොටසක මෙම ස්ථානය පිහිටා ඇති බැවින්, මගීන්ගේ ආරක්ෂාව සහතික කිරීම ඉතා වැදගත් වනු ඇත. කැණීම් යන්ත්‍ර, රෝලර්, ජල බවුසර්, ට්‍රක් රථ සහ ද්‍රව්‍ය හා ජලය රැගෙන යන ලොරි වැනි බර යන්ත්‍රෝපකරණ තිබීම අනතුරු අවදානම වැඩි කළ හැකිය. | වැදගත් |
| **7.2.4.11** ප්‍රවාහන යටිතල පහසුකම් කෙරෙහි ඇතිවන බලපෑම් (විශේෂයෙන් මාර්ග හෝ දුම්රිය ප්‍රවේශය තාවකාලිකව අහිමි වීම, මාර්ග තදබදය මගින් ඇතිවන අවදානම)<br><br>දුම්රිය සේවය තාවකාලිකව නවතා ඇති බැවින්, දුම්රිය මාර්ගයේ ගමනාගමන කටයුතු කෙරෙහි බලපෑමක් ඇති නොවේ. | නොවැදගත් |
| **7.2.4.12** වැඩ **බිම තුළට මිනිසුන් ඇතුළු වීම නිසා ඇතිවන අවදානම**<br><br>දුම්රිය ස්ථාන පරිශ්‍රය තුළ, මගීන් සහ දුම්රිය කාර්ය මණ්ඩලය ගමන් කරන ප්‍රදේශයේ කැණීම් යන්ත්‍ර, ලෝඩර් සහ ට්‍රක් රථ වැනි යන්ත්‍රෝපකරණ භාවිතා කෙරේ. කෙසේ වෙතත්, මගීන්ට හෝ ස්ථානයේ කාර්ය මණ්ඩලයට වෙනත් කටයුතු සඳහා එම ඉදිකිරීම් ප්‍රදේශයට පිවිසීමට විශේෂ අවශ්‍යතාවක් නොමැත.තවද ඉදිකිරීම් සඳහා ලෝහ, වානේ වැනි ද්‍රව්‍ය භාවිතා කළ හැකි අතර ඒවා නුසුදුසු ලෙස ගබඩා කිරීම සහ හැසිරවීම යටතේ හානිකර විය හැකිය. කෙසේ වෙතත්, සාමාන්‍ය පුද්ගලයින්ට අනවසරයෙන් ඇතුළුවීම හිතාමතා හෝ නොදැනුවත්ව සිදුවිය හැකි අතර මෙහෙයුම් යන්ත්‍රෝපකරණ, වාහන, විදුලිය සහ ඒවා පුපුරන ද්‍රව්‍ය නිසා අවදානමට ලක්විය හැකිය. | අතිශයින් වැදගත් |

## 8. ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය

වගුව 4: ස්ථානයට විශේෂිත වූ අවදානම් විශ්ලේෂණය

| අවදානම | බලපෑමට ලක් වූ කණ්ඩායම | අවදානම් මට්ටම |
|---|---|---|
| 1. සීමිත ඉඩකඩක වැඩ කිරීමේදී අනතුරු වලට මුහුණ දීම | කම්කරුවන් | ඉතා ඉහළ |
| 2. ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කිරීම | කම්කරුවන් | අවම |
| 3. කම්කරුවන් විසින් ඉදිකිරීම් භූමිය වෙත අපද්‍රව්‍ය (කුණු, බෝතල් සහ ආහාර) විසි කිරීම | කම්කරුවන් | ඉහළ |
| 4. රාත්‍රී කාලයේ සිදු කරන ඉදිකිරීම් වලදී දුම්රිය මාර්ග අනතුරු වලට මුහුණ දීම | කම්කරුවන් | අවම |
| 5. සීමිත ඉඩකඩක තබා ඇති ඉදිකිරීම් කටයුතු සහ ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන අනතුරු | කම්කරුවන්/අවට ප්‍රජාව | ඉහළ |
| 6. අස්ථායී ප්‍රදේශයේ ජලයෙන් යටවීම | කම්කරුවන් සහ අවට ප්‍රජාව | ඉතා ඉහළ |
| 7. ඉදිකිරීම් අදියරේදී බඹරුන්ගේ ප්‍රහාර | අවට ප්‍රජාව<br>කම්කරුවන් | ඉහළ |
| 8. පිපිරීම්/පිපිරවීම් හේතුවෙන් ජනනය වන පාෂාණ කොටස් නිසා ඇතිවන තුවාල | අවට ප්‍රජාව<br>කම්කරුවන් | අවම |
| 9. විදුලි සැපයුම් මාර්ග සමඟ වැඩ කිරීම | කම්කරුවන් | ඉහළ |
| 10. ව්‍යාපෘති ස්ථානයක වැඩ කිරීම සහ දුර්වල දෘශ්‍යතාවකින් වැඩ කිරීම | කම්කරුවන් | ඉහළ |
| 11. හුදකලාව වැඩ කිරීම | කම්කරුවන් | ඉහළ |
| 12. හදිසි ඉවත් කිරීම | කම්කරුවන් | ඉහළ |
| 13. ආන්තික කාලගුණික තත්ත්වයන් (සුළං, වැසි ආදිය) | කම්කරුවන් | ඉහළ |

## 9. සැලකිය යුතු පාරිසරික හා සමාජ බලපෑම්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ (NBRI) හි විශේෂ අවධානයක් අවශ්‍ය වන පාරිසරික, සමාජීය බලපෑම් හෝ අවදානම් තත්වයන්.

**9.1** සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඩ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය :කොන්ත්‍රාත්කරුවන් සඳහා වන සම්මත ගිවිසුම් ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබද කරුණු

අස්ථායී වී ඇති බෑවුම් ප්‍රදේශයක අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම් කිරීමට අපේක්ෂා කරණ බැවින් බෑවුමේ අස්ථායීතාවයේ ක්‍රියාකාරීත්වය නිසා ඉදිකිරීම් ශ්‍රම බලකාය මුහුණ පෑ හැකි අවදානම ඉහළ ය. **ESMF** හීදී එවන් පොදු **E & HS** ගැටළු සාකච්ජා කර ඇත. ඉදිකිරීම් වැඩ බිමෙහි සේවක ආරක්ෂක අවශ්‍යතාවයන් ලංසු පත්‍රිකාවේ **2003** කොටස: වැඩ කරණ තත්වයන් සහ ප්‍රජා සෞඛ්‍යය හා ආරක්ෂාව හි **2003 5:** ආරක්ෂක උපකරණ සහ ඇඳුම් යන යටතේ වඩාත් විස්තර කර ඇත.

**9.2** ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම

වැඩ කරණ තත්ත්වයන් සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව චක්‍ර ලේඛනයේ **2003.3** වගන්තියට අනුව ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය යොදා ගැනීම සවිස්තරාත්මකව දක්වා ඇත.

## 10. පාරිසරික හා සාමාජීය කළමනාකරණ සැළැස්ම (ESMP)

**7** සහ **8** වැනි කොටස් වලදී හඳුනාගන්නා ලද බලපෑම් සහ අවදානම් විශේෂයෙන් සලකා බලමින් එම බලපෑම් සහ අවදානම් තත්වයන් කළමනාකරණය කිරීමට හෝ අවම කිරීමේ ක්‍රියාමාර්ග. මෙය **ESMP** හි ඇති විශේෂිත නිර්දේශ සහ අවශ්‍යතා වල ඇතුළත් වනු ඇත.

**10.1** නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

මෙම ස්ථානයේ ව්‍යාපෘති පදනම් කරගත් නැවත පදිංචි කිරීමක් නොමැත. ව්‍යාපෘති ක්‍රියාකාරකම් අතරතුර බර යන්ත්‍රෝපකරණ භාවිතය හේතුවෙන් ඇතිවන භූමි කම්පනය නිසා නිවාස වල ව්‍යුහාත්මක හානි සිදුවීමේ හැකියාවක් ඇත. (ව්‍යාපෘතිය හේතුවෙන් ව්‍යුහයන්ට හානි සිදු වුවහොත්, වන්දි ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. (2002.2.17 බලන්න) උපයෝගිතා සහ මාර්ග ආශ්‍රිත පහසුකම් පිළිබඳ විස්තර ESMP ගිවිසුම් අවශ්‍යතා තුළ ඇතුළත් විය යුතුය.

**10.2** පදිංචි ජනතාව ඉවත් කිරීම

හානිය අවම කිරීමේ ස්ථානය සඳහා ව්‍යාපෘති මූලික වූ ඉවත් කිරීමක් අවශ්‍ය නොවේ.

**10.3** හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය)

දිට්වා කුණාටුව හේතුවෙන් ඇති වූ නායයෑමෙන් දුම්රිය යටිතල පහසුකම් සහ ඒ ආශ්‍රිත පහසුකම්වලට සැලකිය යුතු හානි සිදුවීමෙන් අනතුරුව, හානියට පත් දුම්රිය මාර්ග කොරිඩෝරය ආශ්‍රිත ව්‍යුහයන්, පහසුකම් සහ යටිතල පහසුකම් ක්‍රමානුකූලව ඉවත් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය, වන රක්ෂණ දෙපාර්තමේන්තුව සහ අදාළ පළාත් හා පළාත් පාලන ආයතන ඇතුළු සියලුම අදාළ පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය යටතේ, අදාළ නීතිමය හා නියාමන රාමුවලට අනුකූලව විධිමත් ක්‍රියාපටිපාටියක් ආරම්භ කර ක්‍රියාත්මක කළ යුතුය.

**10.4** ව්‍යාපෘතිය ක්‍රියාමාර්ග හේතුවෙන් දේපල/භාවිතයන් අහිමිවීම සඳහා වන්දි ගෙවීම

අවම කිරීමේ ස්ථානය සඳහා ව්‍යාපෘති මූලික වන්දි ගෙවීම් අවශ්‍ය නොවේ.

**10.5** පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම

දුම්රිය පරිශ්‍රයේ පිහිටා ඇති අස්ථායී ඉඩම් කොටස් හේතුවෙන් ඇති වන අවදානම් පිළිබඳව විශේෂයෙන් ඉහළ බෑවුමේ පදිංචිකරුවන් සහ ආසන්න ප්‍රදේශයේ ජනතාව සඳහා දැනුවත් කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**10.6** සැළසුම් මත පදනම් වූ පාරිසරික සමාජ කළමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම

මෙම ව්‍යාපෘති භූමිය ග්‍රාමීය වටපිටාවක් සහිත සෞන්දර්යාත්මක සුන්දර, පරිසර සංවේදී, ස්වභාවික පරිසරයක පිහිටා ඇත. එබැවින්, පාරිසරික හා සමාජීය වශයෙන් වැදගත් සැලසුම් සලකා බැලීම් අනුගමනය කිරීම නිර්දේශ

කරනු ලැබේ. *(වැඩිදුර අධ්‍යනය සඳහා වගුව 6: සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම බලන්න )*

වගුව 5: සැළසුම් අදියරේ දී පාරිසරික හා සමාජ තත්ත්ව සලකා බැලීම

| සැළසුම් අංගය | මෙම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා සලකා බැලීම වන නිර්දේශිත මට්ටම. |
|---|---|
| **i. ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ප්‍රශස්ත ලෙස සැළසුම් කරණය**<br>වෘක්ෂලතාදිය විශාල වශයෙන් ඉවත් කිරීම වැලැක්වීම සහ වැඩුණු ශාක විශේෂ අවම වශයෙන් ඉවත් කිරීම සඳහා ව්‍යාපෘති විශේෂිත සැලසුම් සලකා බැලිය යුතුය. මහ රත්මල් වැනි ආවේණික හා වැදගත් ශාක විශේෂ හමුවන අවස්ථාවලදී, එවැනි ගස් සංරක්ෂණයට ප්‍රමාණවත් අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, නායයාම් හේතුවෙන් මෙම ස්ථානයේ වෘක්ෂලතා ආවරණය විනාශ වී ඇත. | ඉතා ඉහල |
| **ii. ව්‍යාපෘති ස්ථානය සැලසුම්**<br>ව්‍යාපෘති ස්ථානය සැලසුම් කිරීමේදී අස්ථායි බෑවුම් සහ පාංශු කොටස්හි චලනයන් නැවත සක්‍රිය වීම විය හැකි ආකාරය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. එසේම, ව්‍යාපෘති ස්ථානය පිහිටා ඇත්තේ දුම්රිය මාර්ගය සහ වෙන් කිරීමේ ප්‍රදේශයක් වටා වූ ඉතා සීමිත ඉඩකඩක ය. වාහන නැවැත්වීමේ ස්ථාන, ද්‍රව්‍ය ගබඩා කිරීම සහ තාවකාලික කුඩාරම් ආදිය ස්ලයිඩවල මත පාෂාණ කොටස් කඩා වැටෙන අනතුරුදායක කලාපවල ස්ථාපනය නොකළ යුතුය. ඉදිකිරීම් කාලය තුළ පුහුණු ආරක්ෂක නිලධාරියෙකු තබා ගැනීම ඉතා අවශ්‍ය වන අතර කොන්ත්‍රාත්කරුගේ ශ්‍රම බලකාය, දුම්රිය ස්ථානය සහ PMU අතර නිසි සන්නිවේදනයක් ගොඩනගා ගත යුතුය. දුම්රිය දෙපාර්තමේන්තුවේ අවසරය ඇතිව, ආසන්නයේ ඇති SLR ගොඩනැගිලි , කඳවුරු බිම් හෝ ගබඩා නිවාස ලෙස භාවිතා කළ හැකිය. | ඉතා ඉහල |
| **iii. වාසස්ථාන සම්බන්ධතා සහ සත්ත්ව මංපෙත්**<br>ස්ථිර ඉදිකිරීම් සඳහා, ව්‍යාපෘතියට පිවිසීමට, ගැඹුරු කානු පද්ධති ආදිය සඳහා හෝ විශාල වශයෙන් වනාන්තර කොටස් ඉවත් කිරීමට සිදුවන්නේ නම් සැළසුම් තුළ සත්ව වාසස්ථාන අතර සම්බන්ධතා නොබිඳෙන ලෙස පවත්වා ගැනීමට සත්ව මංපෙත්, වෘක්ෂලතා තීරු ආදිය ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. මෙම බලපෑම ප්‍රදේශය අනුව සලකා බැලිය යුතුය . | අවම |
| **iv. ජල සම්පත සංරක්ෂණය**<br>අවම කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ජලය ඉවත් කිරීම සිදු කරන්නේ නම්, එම ලබාගන්නා ජලය උසස් ගුණාත්මකභාවයකින් සහ ප්‍රමාණවත් ප්‍රවාහයකින් යුක්ත වුවහොත් එය ජල මූලාශ්‍රයක් ලෙස භාවිතා කිරීම සලකා බැලිය හැකිය. | ඉහල |
| **v. ස්වභාව සෞන්දර්යාත්මකව ගැලපෙන සැළසුම් සලකා බැලීම**<br>සෞන්දර්යාත්මකව සංවේදී පරිසරයන්හි සැලසුම්, දෘශ්‍ය වශයෙන් සිදුවන දූෂණය අවම මට්ටමක තබා ගැනීම සඳහා ස්වභාවික පරිසරය සමඟ මුසු වන ව්‍යුහයන් සලකා බැලිය යුතුය ව්‍යාපෘති ප්‍රදේශයේ ආර්ථික වර්ධන ලක්ෂ්‍යයක් ලෙස සංචාරක කර්මාන්තය ප්‍රධාන තැනක් ගන්නා බැවින්, එම ප්‍රදේශය සංචාරක ආකර්ෂණයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඉදිකිරීම් කටයුතුවලදී හරිතකරණය භාවිතා කළ හැකිය. සුදුසු අවධානම අවම කිරීමේ ව්‍යුහයන් සැලසුම් කිරීම සඳහා භූ දර්ශන නිර්මාණ ශිල්පියෙකුගේ සේවය වැදගත් විය හැකිය | ඉහළ |
| **vi. හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br>අවධානම අවම කිරීමේ කටයුතු පාරිසරික වශයෙන් සංවේදී වාසස්ථානවල සිදු කරන බැවින්, සැලසුම්වලදී හැකිතාක් හරිත පාරිසරික සැලසුම් සලකා බැලීම අනුමත කරනු ලැබේ. උදා: ඛාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා කිරීම, පරිසරයේ විශේෂ විවිධත්වය පවත්වා ගැනීම සඳහා ශාක සංයෝජනය සහ ආක්‍රමණශීලී විශේෂ ඇතුළත් කිරීම වැළැක්වීම යනාදිය. | ඉහළ |
| **vii. සමාජ හා සංස්කෘතික ලක්ෂණ සංරක්ෂණය**<br>දේශීය සංස්කෘතීන් සහ උරුමයන් ශක්තිමත් වන්නේ ඒවා පවත්වා ගෙන යන ස්වභාවික පරිසරය සමඟ ඇති සමීප සම්බන්ධතා මගිනි. එබැවින් ව්‍යාපෘති ක්‍රියාවන් දේශීය සංස්කෘතිය හා සමාජීය අංගයන් සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති ක්‍රියාවන් වලදී ඒවා ශක්තිමත් කිරීමට අවස්ථාව සලසා දීම සිදු කළ යුතුය. | අවම |

| | |
|---|---|
| **viii.ඉදිකිරීම් කටයුතු වලදී සේවකයින් සහ අවට ප්‍රජාවගේ ආරක්ෂාව**<br>දුම්රිය මාර්ගයට ආසන්නව පිහිටා ඇති බැවින්, විශේෂයෙන් ඉදිකිරීම් කාලය තුළ කම්කරුවන් ඇතුළු ජනතාව අනතුරු වලට ලක්වීමේ හැකියාව පවතින අතර අනවසරයෙන් ඇතුළුවීම සහ නොදැනුවත්කම හේතුවෙන් මෙම භූමිය අවට දරුණු අනතුරු ඇති විය හැකිය. ඉදිකිරීම් අදියරේදී නාය යම් හෝ බිම් ගිලා බැසීම් සක්‍රියවීම් සිදුවිය හැකි අතර එමගින් සේවකයින්ට සහ අවට ජනතාවට තර්ජනයක් විය හැකිය. එබැවින් විශේෂිත වූ බාල්ක, ආරක්ෂිත දැල් වැනි සැලසුම් මත පදනම් වූ ආරක්ෂක සලකා බැලීම් සිදු කළ යුතුය. | ඉතා ඉහල |
| **ix.බාදනය පාලනය සඳහා වන ක්‍රියාමාර්ගයන්**<br>ජලාපවහන කළමනාකරණයේදී, ජලය නිස්සාරණය කර අසල ඇති ඇළ දොළ වෙත බෝක්කු හරහා ගෙන යනු ලැබේ. වැසි සමයේදී ජලාපවහන ව්‍යුහයන්ගේ ගලායාම සැලකිය යුතු ලෙස ඉහළ යා හැකි අතර මෙමගින් ඇළ මාර්ගයන්හි  බාදනයට හේතු විය හැක. එබැවින් ස්වාභාවික ඇළ දොළවලට ඇතුළු වන බාදන ප්‍රවාහයන් අවම කිරීම සඳහා ප්‍රවාහ වේග කඩනයන් භාවිතා කිරීම ප්‍රමාණවත් ලෙස සලකා බැලිය යුතුය. අවම කිරීමේ ස්ථානයේ ආසන්නයේ ඇළ දොළ සහ බෝක්කු තිබේ නම් මෙය සැලසුමේ කොටසක් ලෙස ඇතුළත් විය යුතුය. | ඉහළ |
| **vii. හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br>අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ජලාපවහන කළමනාකරණය සඳහා ගුරුත්වාකර්ෂණ කාණු වැනි අක්‍රීය තාක්ෂණික ක්‍රම සැලකිල්ලට ගත යුතුය. කාණු අවහිර වීම වැළැක්වීම සඳහා නිවැරදි නළ විෂ්කම්භයන්, සිදුරු විෂ්කම්භයන් සහ එළීමේ කෝණයන් සැලකිල්ලට ගත යුතුය. කාණු ජලය ස්වාභාවික දිය පහරවල් වෙත යොමු කිරීමට අපේක්ෂා කරන්නේ නම් බාදන බලවේග වලට ඔරොත්තු දෙන සැලසුම්, අවසාදිත හසුකර ගැනීමේ පද්ධති වැනි අඩු නඩත්තු ව්‍යුහයන් හා සැලසුම් සැලකිල්ලට ගත යුතුය.<br>ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ඉහළ කල්පැවැත්මක් සහිතව කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. වානේ ව්‍යුහයන් භාවිතා කරන්නේ නම් සැලසුම් විශේෂයෙන් මලකඩ වැළැක්වීමේ තාක්ෂණික ක්‍රම සැලකිල්ලට ගත යුතුය. | ඉහල |

## 10.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම

### 10.7.1 ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ පාරිසරික හා සමාජ කළමනාකරණ අනුකූල වීම සඳහා වන ප්‍රමිතීන්

පාරිසරික හා සමාජීය බලපෑම් කළමනාකරණය හා අවම කිරීම සඳහා වන පියවර සාමාන්‍යයෙන්  සෑම ව්‍යාපෘති ස්ථානයකටම පොදු ය. පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග  සාමාන්‍යයෙන්  සියලූ නායයාම් අවම කිරීමේ ස්ථාන සඳහා පොදු වේ. මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීමේ කටයුතු වල ක්‍රියාකාරිත්වයට  හේතු වේ. එබැවින් ඉදිකිරීමේදී වන බලපෑම අවම කිරීම කොන්ත්‍රාත්කරුගේ  යුතුකමකි. ඉදිකිරීම් අදියරේදී කොන්ත්‍රාත්කරුවන්ගේ  ලංසු පත්‍රිකාවේ  ඇතුලත් කර ඇති පාරිසරික, සමාජ, සෞඛ්‍ය  සහ ආරක්ෂණ (ES & HS) කළමනාකරණයට අනුකූලව කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාව  කෙසේ විය යුතුද යන්න පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කර ඇත. මෙම කොටස සඳහා අදාළ අංශවල ගුණාත්මක බව දැක්වෙන ප්‍රධාන  කොටස් පහත දක්වා ඇත (වගුව 7). විස්තර සඳහා, ESMP ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්  සඳහා යොමු කළ යුතුය.

වගුව 6: පාරිසරික හා සමාජ ආරක්ෂණයට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවයන්  ES & HS

| පාරිසරික සමාජයීය කළමනාකරණ සැළසුමට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දක්වන එකඟතාවය | අයිතමය | ව්‍යෘපෘතිය සදහා අදාලත්වය |
|---|---|---|
| **2002.  පාරිසරික හා සමාජ අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩ බිම තුල ගබඩා කිරීම | අතිශයින්ම අදාල වේ (දුම්රිය මාර්ග පීලි |
| 2002.2 2) | ශබ්ධය සහ කම්පන | අදාළ නොවේ |
| 2002.2 3) | ගොඩනැගිලි ඉරිතැලීම් සහ හානි සිදුවීම | අදාළ නොවේ |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | අදාල වේ (කම්කරුවන් ) |
| 2002.2 5) | කසල  බැහැර කිරීම | අතිශයින්ම අදාල වේ (අවට ප්‍රජාව) |
| 2002.2 6) | දූවිලි පාලනය | අදාල වේ (කම්කරුවන්) |

| | | |
|---|---|---|
| 2002.2 7) | ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කසල ප්‍රවාහනය | අතිශයින්ම අදාල වේ |
| 2002.2 8) | ජලය | අතිශයින්ම අදාල වේ |
| 2002.2 9) | ශාක සහ සතුන් | අතිශයින්ම අදාල වේ |
| 2002.2 10) | භෞතික සහ සංස්කෘතිකමය සම්පත් | අදාල නොවේ |
| 2002.2 11) | පාංශු ඛාධනය | අදාල වේ |
| 2002.2 12) | පස සමග මිශ්‍ර වීම | අදාල වේ |
| 2002.2 13) | පොලොව හැරීම | අදාල වේ |
| 2002.2 14) | ගල් කොරි ක්‍රියාකාරකම් | අදාල නොවේ |
| 2002.2 15) | නඩත්තු වාහන සහ යන්ත්‍රෝපකරණ | අදාල වේ |
| 2002.2 16) | මහජන පීඩා | අදාල වේ |
| 2002.2 17) | උපයෝගිතා සේවා හා පහසුකම් | අතිශයින්ම අදාල වේ |
| 2002.2 18) | දෘෂ්‍ය පරිසරය වැඩිදියුණු කිරීම | අදාල වේ |
| **2002-5.** පාරිසරික අධීක්ෂණය | මූලික සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරිතැලීම් සමීක්ෂණ) | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | ඉදිකිරීම් අතරතුර සමීක්ෂණ (වාතය, ජලය, ශබ්ද, කම්පන, ඉරිතැලීම් සමීක්ෂණ) | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | මෙහෙයුම් කාලය තුල වැඩබිම් සමීක්ෂන | ව්‍යාපෘති විශේෂිත නිරීක්ෂණ සැලැස්ම අධ්‍යයනය |
| | වාර්තා තැබීම හා පවත්වාගෙන යාම | අදාල වේ |
| **2003**. **වැඩබිම් කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව** | | |
| 2003.2 | ආරක්ෂක ක්‍රම සංවිධානය සහ සන්නිවේදනය | අතිශයින්ම අදාල වේ (අනාරක්ෂිත බැවුම, බර යන්ත්‍රෝපකරණ) |
| 2003.3 | ළමා ශ්‍රමය හා බලකිරීම | අදාල වේ |
| 2003.4 | ආරක්ෂාව පිළිබඳ වාර්තා සහ අනතුරු සහ ඒ පිළිබඳ දැනුම්දීම | අදාල විය හැකිය |
| 2003.5 | ආරක්ෂක උපකරණ සහ ඇඳුම් පැලඳුම් | අතිශයින්ම අදාල වේ |
| 2003.6 | ආරක්ෂක තත්ත්වය පරීක්ෂාව | අතිශයින්ම අදාල වේ |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම් | අතිශයින්ම අදාල වේ |
| 2003.8 | සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ පුහුණුව | අතිශයින්ම අදාල වේ |
| 2003.9 | යන්ත්‍රෝපකරණ සහ සුදුසුකම් ලත් පුද්ගලයින් | අදාල වේ |

***අදාල වේ :*** *ඕනෑම ඉදිකිරීම් ප්‍රදේශයක් සඳහා මෙය අදාල කරගත හැක. (* ESMP)
***අතිශයින්ම අදාල වේ :*** *අදාල ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී ලෙස නිර්මාණය කරණ ලද පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම් සඳහා තහවුරු කිරීමට කොන්ත්‍රාත්කරු විශේෂයෙන් පාරිසරික ක්‍රමවේදයක් ලෙස අවදාරණය කළ යුතුය.*
***අදාල විය හැකිය :*** *ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතරතුර ඉදිකිරීම් ප්‍රදේශයේ අදාල අංශයන් අවදානය යොමු වුවහොත් පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම් මගින් ක්‍රියාත්මක කල හැක.*
***අදාල නොවේ :*** *අනාවරණය වූ කොන්දේසි මත මෙම ඉදිකිරීම් ප්‍රදේශය ට අදාල නොවේ.*
***විකල්ප:*** *අවශ්‍යතාවයන් මත ක්‍රියාත්මක වේ.*
***ඉදිකිරිම් ප්‍රදේශයට සුවිශේෂී වූ අධීක්ෂණ සැලසුම් යොමු කිරීම:*** *ඉදිකිරීම් ප්‍රදේශයට සුවිශේෂී වූ අධීක්ෂණ සැලසුම්වලට අනුව කොන්ත්‍රාත්කරු අධීක්ෂණ කටයුතු සිදු කිරීමට බැදී සිටී.*
***මූලාශ්‍ර :*** *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරු හා පාරිසරික හා සමාජීය කළමනාකාර සැළසුම සමග ඇති බැඳීම*

**10.7.2** නාය ස්ථානයට විශේෂිත හානිය අවම කිරීම

ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අපදා අවම කිරීමේ පියවරයන් පහත සඳහන් පරිදි වේ.*(වැඩිදුර අධ්‍යනය සඳහා වගුව 8: ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනු ලබන පියවර බලන්න )*

වගුව 7: ස්ථානීය ES & HS අවම කිරීම සඳහා ගනු ලබන පියවර

| හානි අවම කිරීමේ අයිතමය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියර | වගකීම් |
|---|---|---|
| **i. ප්‍රමුඛ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධ ගැටළු**<br>වැඩබිමේ සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ වැඩ කිරීමට සිදු වන බැවින්, ESMP පිළිබඳ කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීමේ 2003 වගන්තියේ දක්වා ඇති " සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව " යටතේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ මෙම නිර්දේශයන් නිසි සංවිධානයක් සහ ආරක්ෂක නිරීක්ෂණ ක්‍රමයක් තුළ අනුගමනය කළ යුතුය.ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර විශේෂ වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.<br>• ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර විශේෂ වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ සැලැස්මක් සකස් කරන්න.<br>• සම්මත සේවක ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම<br>• ආරක්ෂිත සපත්තු, හිස්වැසුම්, ආරක්ෂිත ඇඳුම් ඇස් කණ්ණාඩි වැනි පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) සැපයීම.<br>• සේවකයින්ට පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ලබා දීම<br>• ප්‍රධාන ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට පෙර උපද්‍රව විශ්ලේෂණය සිදු කිරීම සහ හඳුනාගත් එවැනි උපද්‍රව සඳහා ප්‍රමාණවත් අවම කිරීමේ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම/සැපයීම.<br>• බඹර කූඩු ආදිය එම ආසන්නයේ පිහිට තිබේ නම්, සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඉවත් කිරීමේ මධ්‍යස්ථාන භාවිතා කිරීම අනිවාර්ය වේ.<br>• තවද, අස්ථායී බිම්වල අවම කිරීමේ කටයුතු සිදු කිරීම වැසි සමයේදී අධික අවදානමක් සහිත වන බැවින්, වර්ෂාව පවතින කාලයේදී ප්‍රමාණවත් කාල සීමාවක් සඳහා එම කටයුතු නතර කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | PMU ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු දුම්රිය දෙපාර්තමේන්තුව |
| **ii. ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය**<br>නාය යාමට ලක් වූ ප්‍රදේශයට ඉතා ආසන්නව ධාවනය වන දුම්රිය මාර්ග හරහා / ඔස්සේ ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කිරීමට පෙර SLR හි බලයලත් පුද්ගලයාට දැනුම් දී අවසර ලබා ගත යුතුය.<br>ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ප්‍රවාහන කාලසටහන පිළිබඳව මගීන් සහ සේවකයින් දැනුවත් කළ යුතු අතර ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය හේතුවෙන් දුම්රිය ස්ථාන වේදිකාවට හෝ දුම්රිය ට්‍රැක් රථවලට හානි සිදු නොවිය යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | PMU ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු දුම්රිය දෙපාර්තමේන්තුව |
| **iii. පිපිරීම්/පුපුරවා හැරීම් නිසා ගල් කැබලිවලින් සිදුවන තුවාල**<br>පිපිරවීම් සිදු කිරීමට පෙර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ බලයලත් පුද්ගලයන් හට දැනුම්දීම සහ අවසර ලබා ගත යුතු වන අතර දුම්රිය ප්‍රවාහන කාලවලදී සියළු පුපුරවා හැරීමේ කටයුතු නවතා, ආසන්න දුම්රිය ස්ථානය හරහා දැනුම්දීමේ නිවේදන සිදු කළ යුතුය. පිපිරීම්/පුපුරවා හැරීම් නිසා පාෂාණ කැබලිවලින් සිදුවන තුවාල සඳහා හදිසි අනතුරු සුදානම් කිරීමේ සැලැස්මක් ස්ථාපනය කිරීම කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු දුම්රිය දෙපාර්තමේන්තුව |
| **iv. දුම්රිය පීලි ජලයෙන් යටවීම**<br>ඉදිකිරීම් කාලයේදී, දුම්රිය පීලි සහ මාර්ගය ජලයෙන් යටවීම අපේක්ෂා කළ හැකිය. මෙම බලපෑම අවම කිරීම සඳහා, කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර අතිරික්ත ජලය ආසන්න ඇළ හෝ ජල මාර්ගයකට යොමු කරන තාවකාලික මතුපිට සහ උප මතුපිට ජලාපවහන ජාලයක් ඉදි කළ යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **v. ඉදිකිරීම් අතරතුර බාධන බලපෑම් අවම කිරීම**<br>වැසි සමයේදී භූමිය පිරිසිදු කිරීම, බැවුම් නැවත සකස් කිරීම, පාෂාණ කොටස් ඉවත් කිරීම වැනි අවම කිරීමේ කටයුතු වළක්වා ගැනීම නිර්දේශ කරනු ලැබේ. එබැවින්, වියළි කාලයේදී බැවුම් මත නාය යාම අවම කිරීමේ කටයුතු සිදු කිරීම අත්‍යවශ්‍ය වන අතර, වැසි සමයේදී බැවුම් ප්‍රදේශයේ එවැනි ක්‍රියාකාරකම් හැකිතාක් වළක්වා ගත යුතුය. එබැවින් ව්‍යාපෘති සැලසුම් කිරීමේ අදියරේදී මෙය සලකා බැලිය යුතුය. **තවද අපද්‍රව්‍ය ගලායාම අඩු කිරීම සඳහා රොන්මඩ උගුල් හඳුන්වා දිය යුතුය** | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **vi.ආක්‍රමණික විශේෂ**<br>බාධනය පාලනය කිරීමේ ව්‍යුහයන් ලෙස ආක්‍රමණික ශාක විශේෂ භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. ශාකමය බාධන පාලනය සඳහා දේශීය ශාක තෝරා ගත යුතු අතර ශාකමය පාලන පියවර සඳහා භාවිතා කරන විශේෂ සඳහා අදාළ බලධාරීන්ගේ අනුමැතිය අවශ්‍ය වේ. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **vii. ශබ්දය සහ කම්පන පාලනය**<br>ව්‍යුහයන්ට හානි වීම වළක්වා ගැනීම සඳහා කම්පන ජනනය කරන ක්‍රියාකාරකම් නියමිත සීමාවන් තුළ සිදු කළ යුතුය. ඉදිකිරීම් කටයුතු හේතුවෙන් නිවාස සහ යටිතල පහසුකම් කෙරෙහි හානි ඉරිතැලීම් සිදුවුවහොත් සුදුසු වන්දි ගෙවිය යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **viii. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br>ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විශේෂ අවධානයක් යොමු කළ යුතු වා අතර මෙම භූමිය පිහිටා ඇත්තේ පොදු ස්ථානයක් තුළ ප්‍රසන්න පරිසරයක් සහිත ග්‍රාමීය භූමි ප්‍රදේශයක වේ. එබැවින් එවැනි අපද්‍රව්‍ය ජනනය වුවහොත් සෝදා ඉවත් නොකර නිසි ලෙස ගබඩා කර PMU විසින් අනුමත ක්‍රියා පටිපාටියට අනුව බැහැර කළ යුතුය. ඉදිකිරීම් අපද්‍රව්‍ය දුම්රිය පීලි දෙපස බැහැර නොකළ යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **ix. සේවකයින් සඳහා ස්ථානීය සනීපාරක්ෂක පහසුකම්**<br>සේවකයින් විවෘතව මළපහ කිරීම අවම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් භූමිය තුළ ශ්‍රම බලකාය සඳහා තාවකාලික සනීපාරක්ෂක පහසුකම් සකස් කළ යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **x. දූවිලි හා වායු පාලන ක්‍රමවේද**<br>ඉදිකිරීම් කාලය තුළ ජනනය වන දූවිලි මගින් මගීන් සහ සංචාරකයින් හට බලපෑම් ඇති කළ හැකිය. එබැවින් අධික දූවිලි හෝ වායු උත්පාදන ක්‍රියාකාරකම් අපේක්ෂා කරන්නේ නම් විශේෂ ආවරන තිර ආදිය භාවිතා කළ යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xi. ඉදිකිරීම් සඳහා ජලය සහ විදුලිය භාවිතය**<br>ඉදිකිරීම් සඳහා ජලය ලබා ගත යුත්තේ අනුමත ස්ථාන වලින් පමණි. කොන්ත්‍රාත්කරු ප්‍රධාන විදුලි මාර්ගයෙන් විදුලිය භාවිතා කිරීමට අදහස් කරන්නේ නම්, ඔවුන්ට දැනුම් දී අවශ්‍ය අවසරය ලබා ගත යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xii. වැඩ කරන වේලාවන්, අධික අයහපත් කාලගුණික තත්ත්වයන් යටතේ වැඩ කිරීම සහ දෘශ්‍යතාව අඩු තත්ත්වයන් යටතේ වැඩ කිරීම**<br>ඉදිකිරීම් කටයුතු දිවා සහ රාත්‍රී යන කාල දෙකෙහිම සිදු කළ යුතු වේ. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු දුම්රිය දෙපාර්තමේන්තුව |
| **xiii. යටිතල පහසුකම් මත බලපෑම**<br>PMU හි අනුමැතියට අනුව ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර දුරකථන, විදුලිය සහ ජල මාර්ග ස්ථානගත කළ යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xiv. ඉදිකිරීම් අතරතුර මනා ලෙස භූමිය පවත්වා ගැනීම**<br>දෘශ්‍ය දූෂණය අවම වන පරිදි පවත්වා ගත යුතුය | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **xv.** **සේවක හැසිරීම් සංග්‍රහය**<br>කොන්ත්‍රාත්කරු විසින් එකඟ වූ ආචාර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාමෙන් ශ්‍රම බලකාය සහ ගැමියන්, දුම්රිය ස්ථානයේ නිලධාරීන්, මගීන් සහ සංචාරකයන් අතර ඇති විය හැකි ආරවුල් වළක්වා ගත යුතුය.<br><br>විශේෂයෙන්ම පොදු නාන සහ රෙදි සෝදන ස්ථාන වැනි හවුල් සම්පත් භාවිතා කරන විට ශ්‍රම බලකාය සහ සිසුන් සහ විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලය අතර ඇති විය හැකි ආරවුල් වළක්වා ගත යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xvi.** සර්ප දෂ්ට කිරීම්, විෂ සහිත කෘමීන් දෂ්ට කිරීම් කළමනාකරණය සහ හදිසි අනතුරු මගින් හදිසි කළමනාකරණය<br>සර්ප දෂ්ට කිරීම් සහ විෂ සහිත කෘමීන් දෂ්ට කිරීම් සඳහා නිසි හදිසි කළමනාකරණ පද්ධතියක් (සර්ප දෂ්ට කිරීම් පිළිබඳ දැනුවත්භාවය, වැඩ කරන අතරතුර ආරක්ෂිත සපත්තු, සර්ප දෂ්ට කිරීමකදී ප්‍රථමාධාර, රෝහල්ගත කිරීම සහ සර්ප දෂ්ට කිරීම් කළමනාකරණ පහසුකම් ඇති නිවැරදි රෝහලට ඇතුළත් කිරීම ඇතුළුව) හඳුන්වා දිය යුතුය.<br>මෙවැනි ස්ථානවල අනතුරු බහුලව දක්නට ලැබේ. මෙම ස්ථානය සඳහා අනෙකුත් අනතුරු සඳහා නිසි හදිසි කළමනාකරණ ඒකකයක් (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂක අයිතම, රෝහල්ගත කිරීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම්) පවත්වාගෙන යා යුතුය. | ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xvii.** ශාක සහ සත්ත්ව ප්‍රජාව ආරක්ෂා කර ගැනීම<br>ව්‍යාපෘති බලපෑම් ප්‍රදේශය තුළ දුම්රිය රක්ෂිත භූමිය තුළ පිහිටා ඇති කන්දේ ඇළ වනාන්තරය ඉහළ ජෛව විවිධත්වයකින් සහ ආවේණික ශාක හා සත්ව විශේෂවලින් සමන්විත වේ<br>බැවුම් ප්‍රදේශයේ පිහිටා ඇති මහා-රත්මල් (***Rhododendron arboreum***) වැනි ශාක ආවේණික විශේෂ ලෙස සැලකෙන අතර, ඒවා **IUCN** රතු ලැයිස්තුවේ අවම අවධානය යොමු කළ යුතු ලෙස වර්ගීකරණය කර ඇත. ඒ සමඟම, අවදානමට ආසන්න ලෙස **IUCN** ලැයිස්තුවේ සඳහන් වන දිවියා (***Panthera pardus***), සහ වැලි මුවා / මන්ටජැක් (***Muntiacus muntjak malabaricus***) වැනි සත්ත්ව විශේෂද මෙම ස්ථානය ආසන්නයේ දැකිය හැකිය. එබැවින් ඉදිකිරීම් කටයුතු අතරතුර ශාක හා සත්ත්ව විවිධත්වයට සැලකිය යුතු අවධානයක් යොමු කල යුතුය. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xviii.** වනාන්තර ප්‍රදේශයේ ගිනිගැනීම් ඇතිවීම<br>මෙය හිතාමතා හෝ නොදැනුවත්ව සේවකයන් මගින් ඇතිවිය හැක. වනාන්තර ප්‍රදේශයක් බැවින් මෙයින් විය හැකි බලපෑම ඉතා විශාල විය හැක. | ව්‍යාපෘති භූමිය සූදානම් කිරීමේදී සහ ඉදිකිරීම් කාලය තුළ | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

### 10.7.3 ස්ථානයට අදාල විශේෂිත අධීක්ෂණ තත්ත්වයන්

ඉදිකිරීම් අදියර තුළ පහත සඳහන් අධීක්ෂණ සැලැස්ම නිර්දේශ කර ඇත. මීට අමතරව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම පිළිබඳ සඳහන් කළ යුතු නිරීක්ෂණ ක්‍රියා පටිපාටිය ද ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරණ ලද ඉල්ලුම්පත තුළ ඔහුගේ නිපුණතා පිළිබඳ අදාළ ලේඛන සමඟ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ESMP වැඩපිළිවෙළ යොමු කරණු ඇත. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්විය යුතුය. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික සහ සමාජ කළමනාකරණ ක්‍රම පිලිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එය PMU ඒකකය මගින් අනුමත කිරීමට නියමිතය.(වැඩිදුර අධ්‍යානය සඳහා වගුව 9: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර )

වගුව 8: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර

| අධීක්ෂණ අවශ්‍යතාවය | පරාමිතීන් | වාර ගණන |
|---|---|---|
| i. මූලික නිරීක්ෂණ | ජලයේ ගුණාත්මකභාවය | වරක් * |
| | ඉදිකිරීම් සිදු කිරීමට පෙර දුම්රිය ස්ථානයේ පෙර ඉරිතැලීම් සමීක්ෂණය | වරක් * |
| | භූමියේ සිදුවන කම්පන | වරක් * |

| | | |
|---|---|---|
| | වායු ගුණාත්මකභාවය: වායු අංශු | වරක් * |
| | පසුබිම් ශබ්දය මැනීම | වරක් * |
| ii. ඉදිකිරීම් අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | වැසි සමයේදී ජලයේ පෙනුමේ සැලකිය යුතු වෙනසක් සිදුවුවහොත් |
| | අවදානම් ගොඩනැගිලි වල පූර්ව ඉරිතැලීම් නිරීක්ෂණය | ඉදිකිරීම් අතරතුර සැලකිය යුතු විස්ථාපනයක් දක්නට ලැබේ නම් ** |
| | භූමියේ සිදුවන කම්පන | විදුම් යන්ත්‍රෝපකරණ, විදුම් වැඩ, හෝ භූ කම්පන ජනනය කරන ඕනෑම කාර්යයක් ක්‍රියාත්මක කිරීමේදී * |
| | ඉදිකිරීම් වල දී ඇති වන ශබ්දය | අධික ශබ්ද උත්පාදන කාලවලදී මසකට වරක් * |
| | වායු ගුණාත්මකභාවය: වායු අංශු | මසකට වරක් * |
| iii. වාහන මගින් සිදුවන විමෝචනය | සියලුම යන්ත්‍රෝපකරණ/වාහන මෙහෙයුම් කටයුතු සඳහා අදාළ වන පරිදි විමෝචන පාලන පරීක්ෂණ සහතිකය ලබා තිබිය යුතුය - උපදේශක පාර්ශවයේ ස්ථානීය ES නිලධාරියා විසින් පරීක්ෂා කළ යුතුය. | |
| iv. අධීක්ෂණ ආයතනය | *මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි සහතික සහිත ස්වාධීන අධීක්ෂණ ආයතනයක් මගින් ඉරිතැලීම් පරීක්ෂණ හැර අනෙකුත් පරීක්ෂණ සඳහා යොදාගත යුතුය.<br>**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය :PMU විසින් පිළිගනු ලබන විශ්වාසී ආයතනයක් මගින් ඉරිතැලීම් පරීක්ෂණ කල යුතුය | |
| v. වාර්තා කිරීමේ අවශ්‍යතා | **ජල මාර්ග වල ජලයේගුණාත්මකභාවය** – 2019 අංක 01 දරණ ජාතික පාරිසරික (පරිසර ජල තත්ව) රෙගුලාසි සමඟ සැසඳීම<br>**අධි අවදානම් ගොඩනැගිලි පිළිබඳ පූර්ව ඉදිකිරීම් ඉරිතැලීම් සමීක්ෂණය** - වෘත්තීමය වාර්තාව<br>**පොළවේ සිදුවන කම්පනයන්** - යන්ත්‍ර සූත්‍රවලින් ඇති වන පොළවේ කම්පනයන්,ඉදිකිරීම් අතරතුර හා වාහන වලින් ඇතිවන කම්පනයන්, මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව<br>**වට පිටාවෙන් ඇති වන ශබ්දය මැනීම** - මධ්‍යම පරිසර අධිකාරියේ අංක 924.1 1996 මැයි 23 දින විශේෂ ගැසට් පත්‍රය<br>**වායු ගුනාත්මකභාවය සම්බන්ධ කරුණු** - ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ අංක 1562/22 2008 අගෝස්තු 15 - විශේෂ විවේදනයේ සඳහන් අවම වායුගුණ තත්ත්වයන් | |

## 11. පදිංචි ජනතාව සහ පාර්ශවකරුවන්ගේ උපදේශන - පවත්වා ඇති හෝ පැවැත්වීමට නියමිත උපදේශන සේවාවන්

### 11.1 මහජන උපදේශන

477A අඹේවෙල කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිනිය එම්. එස්. ඒ. ඒ. ජී. චතුරානි මහත්මිය නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය, අවම කිරීමේ ව්‍යාපෘතිය සහ අරමුදල් යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කරන ලදී. ඔහු අවම කිරීමේ කටයුතුවල වැදගත්කම පිළිගත් අතර ව්‍යාපෘතියට පූර්ණ සහයෝගය සහ දායකත්වය සපයන බව ප්‍රකාශ කළේය.

### 11.2 දැනුවත් කිරීම් සඳහා සම්බන්ධ වූ පාර්ශවකරුවන් උපදේශනවලදී ලබා දුන් නිර්දේශ හෝ එකඟතාවන් (ඇමුණුම II බලන්න)

අඹේවෙල දුම්රිය ස්ථානයේ ස්ථානාධිපති ඩබ්ලිව්.එච්. ලක්මාල් මහතා අවම කිරීම සම්බන්ධ ව්‍යාපෘති කටයුතු පිළිබඳව දැනුවත් කරන ලදී. ඔහු අවම කිරීමේ කටයුතුවල අවශ්‍යතාවය පිළිගෙන, ව්‍යාපෘතිය සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කළාය.

## 12. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යෝග්‍යතා , කැමැත්ත ප්‍රකාශනය , එකඟතාව සහ අනුමත කිරීම්

වගුව 9: බාධා ඉවත් කර ගැනීම්, විරෝධතා නොමැති බව, කැමැත්ත සහ අනුමත කිරීම්

| අවශ්‍යතාවය / අනුමත කිරීම / ආයතනය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|
| **12.1** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | |

| | |
|---|---|
| දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය | ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට සිදුවනු ඇති අතර මෙහිදී මහ ඇමති වරයා සහ දිස්ත්‍රික්කයේ වගකිව යුතු ආයතන සහභාගී වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හමුවේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ යුතු වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරියෙකු ව්‍යාපෘතිය පිළිබඳ විස්තර කරමින් එහි විවිධ පාරිසරික සහ සාමාජයීය ගැටළු ආදිය ගැන කරුණු ඉදිරිපත් කරණු ඇත. මෙම ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් මෙම රැස්වීමේදී ගනු ලබන නිර්දේශ මෙම පාරිසරක සහ සමාජයීය කළමනාකරණ සැලසුම ක්‍රියාවට නංවන විට සැලකිල්ලට ගැනෙනු ඇත. |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | මෙම ව්‍යාපෘතියට නුවරඑළිය පළාත් පාලන ආයතනයේ සැලසුම් කමිටුවේ අනුමැතිය. |
| 12.2 ව්‍යාපෘතියට අදාළ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය | |
| මධ්‍යම පරිසර අධිකාරිය | බැවින් දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය වේ. |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන රක්ෂිත වෙන්කිරීම් කලාපයක යටතේ හෝ තුළ මෙම ව්‍යාපෘති වැඩබිම පිහිටා නොමැති බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | භූමි, පාෂාණ හා ඛනිජමය සුන්බුන් ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාරයාංශයේ අනුමැතිය ලබාගත යුතුය (අවශ්‍යනම් පමණි) |
| නුවරඑළිය ප්‍රාදේශීය සභාව | අපද්‍රව්‍ය සහ ශාක අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගනු ඇත. |
| ලංකා විදුලිබල මණ්ඩලය | ව්‍යාපෘති භූමියේ විදුලිබල සැපයුම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමැතිය අවශ්‍ය වේ. |
| ජාතික ශාක නිරෝධායන සේවය | ජෛව ව්‍යාපෘති කළමනාකරණය කරන ලද බැවුම් අවම කිරීම සඳහා අවශ්‍ය ශාක හෝ බීජ ශ්‍රී ලංකාවට ආනයනය කළ යුත්තේ 1999 අංක 35 දරණ පැලෑටි සංරක්ෂණ පනත යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්, අතිරේක අධ්‍යෂක ජාතික ශාක නිරෝධායන සේවය, කටුනායක වෙතින් නිකුත් කරන ලද ශාක ආනයන බලපත්‍රයක අධිකාරිය යටතේ සහ එහි කොන්දේසි වලට අනුකූලවය. |
| 12.3 පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් අනුමැතිය ලබාගැනීම/නෛතික බැදීම්/ විරුද්ධත්වයක් නොමැති වීම | |
| ඉඩම් හිමිකරුවන් (දුම්රිය දෙපාර්තමේන්තුව, කන්දේ ඇළ වන රක්ෂිතය ) | ඉඩම් හිමිකරු සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව ගිවිසුමක් අත්සන් කිරීම, ව්‍යුහයන් ඉවත් කිරීමට, ඉඩමට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගුකාලීන නඩත්තු කටයුතුවල නිරත වීමට කිසිදු විරෝධයක් නොදක්වන බවට එකගතාවය ලබා ගත යුතුය. |

අනුමැතීන් ලබා ගැනීම යොජිත කාල රාමුව වගු අංක 11න් දක්වා ඇත.

වගුව 10: අනුමැතීන් ලබාගැනීම සඳහා නියමිත කාල රාමුව

| අනුමැතීන් | මාසය 1 | | | | මාසය 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය1 | සතිය2 | සතිය3 | සතිය4 | සතිය1 | සතිය2 | සතිය3 | සතිය4 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේඛම් කාර්යාලයේ අනුමැතිය**<br>අයදුම් කිරීම<br>ව්‍යාපෘති සාකච්ජාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම | | | | | | | | |
| **සැළසුම් කමිටුවේ අනුමැතිය අයදුම් කිරීම**<br>ව්‍යාපෘති සාකච්ජාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමත කිරීම | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **රජයේ ඉඩම් හිමියන්ගේ මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය**<br>අයදුම්පත බාරදීම<br>දක්වන අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමැතීන් | | | | | | | | |
| **වෙනත් අනුමැතීන්**<br>භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ<br>ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය (අවශ්‍යතාවය අනුව) | | | | | | | | |
| ඉඩම් හිමිකරුවන්ගේ අනුමැතිය/කැමැත්ත ලබාගැනීම | | | | | | | | |

## 13. දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය

මෙම ව්‍යාපෘති යේ බලපෑමට ලක්වූ ප්‍රජාව සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා උපදේශකවරුන් වන PMU හි ES නිලධාරි වරයා වගබලා ගත යුතුය. (*යොමුකිරීම: දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම සඳහා නිර්දේශිත ක්‍රියා පටිපාටිය සඳහා පරිසර හා සමාජ කළමනාකරණ රාමුව)*

## 14. තොරතුරු අනාවරණය කිරීම

පහත දැක්වෙන ආයතන සහ සංවිධාන අනුව ලකුණු කරණ ලද වගුව 12 ආකෘතිය මගින් ES තොරතුරු අනාවරණය කිරීම PMU හි වගකීම වේ.

වගුව 11: තොරතුරු අනාවරණය කිරීමේ යෝජිත සැළැස්ම

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු සන්නිවේදන ක්‍රමවේදය |
|---|---|---|
| i. ව්‍යාපෘතිය සැලසුම් කිරීම (ඉදිකිරීම් ප්‍රදේශයේ තොරතුරු, සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය) | දිස්ත්‍රික් CEA, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,දුම්රිය ස්ථානාධිපති, වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන, ජා.ගො.ප.ආ දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව.ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධ වාර්තා සැපයීම, අනුමැතීන් හා එකඟතා |
| ii. පාරසරික හා සාමාජීය කළමනාකරණ සැලසුම | දිස්ත්‍රික් CEA, දුම්රිය ස්ථානාධිපති, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව.ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධ වාර්තා සැපයීම, අනුමැතීන් හා එකඟතා |
| iii. ප්‍රගති වාර්තා (මූලික අදියරේදී හා ඉදිකිරීම් අතරතුර) | දිස්ත්‍රික් CEA, AIIB හා වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන | ප්‍රගති සමාලෝචන රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාල වාර්තා භාර දීම. |
| iv. කම්කරුවන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය පාරිසරික යෝග්‍ය බව අදාල ඉදිකිරීම් භූමියේ සුපරීක්ෂණය | දිස්ත්‍රික් CEA, ප්‍රාදේශීය ලේකම්, පොලීසිය, රජයේ ඉඩම් හිමියන්, ග්‍රාම නිලධාරී, ජා.ගො.ප.ආ දිස්ත්‍රික් කාර්යාලයල AIIB වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියොජිත ආයතන | වාචික හා අවිවාචික (ලිඛිත) සන්නිවේදනය, ආදාල වාර්තා භාරදීම |
| v. ES කාරණාවලට අදාළව ගත් තීරණ සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, පොලිසිය, රජයේ ඉඩම් හිමියන්, ග්‍රාම නිලධාරි, NBRI දිස්ත්‍රික් කාර්යාලය , AIIB සහ අදාළ පාර්ශවයන් සුදුසු පරිදි | රැස්වීම්, අදාල වාර්තා භාර දීම. |
| vi. දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය | අදාළ පාර්ශව, AIIB | රැස්වීම්, වාචික හා අවිවාචික (ලිඛිත) සන්නිවේදනය |

වගුව 12: තොරතුරු රැස්කිරීම සඳහා සම්බන්ධ කරගත් ආයතන සහ නිලධාරීන්

| දිනය | ආයතනය | තොරතුරු සඳහා සම්බන්ධ වන නිලධාරියා |
|---|---|---|

| | | |
|---|---|---|
| 28/04/2026 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | ඩබ්ලිව්.එච්. ලක්මාල් මහතා,<br>දුම්රිය ස්ථානාධිපති - අඹේවෙල දුම්රිය ස්ථානය |
| 11/05/2026<br>(දුරකථනය හරහා) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නුවරඑළිය | ඒ.ඒ.ජී. චතුරානි මිය<br>ග්‍රාම නිලධාරී<br>අංක 477A, අඹේවෙල කොට්ඨාසය |

**ඇමුණුම 1: ව්‍යාපෘති ප්‍රදේශයේ සහ අදහස් විමසීම් සිදුකරණ අතරතුර ලබාගත් ඡායාරූප**



*ඩබ්ලිව්.එච්. ලක්මාල් මහතා (දුම්රිය ස්ථානාධිපති - අඹේවෙල දුම්රිය ස්ථානය) සමඟ පැවති සාකච්ඡාව*

**ඇමුණුම II: පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ඡා තුලදී අනාවරණය වූ විශේෂ කරුණු :නුවරඑලිය දිස්ත්‍රික්කය**

| ආයතනය | සම්බන්ධීකරණ නිලධාරීගේ නම සහ තනතුර | ඉදිරිපත් වූ සැලකිය යුතු කරුණු |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය | එම්.එම්.ඒ.අයි. ජනක මහතා, පළාත් අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය මධ්‍යම පළාත. | ✓ ව්‍යාපෘති ය සඳහා අයදුම්පත පිරවීමට සහ එය ඉදිරිපත් කිරීම සඳහා මූලික තොරතුරු ප්‍රශ්නාවලියක් (BIQ) අවශ්‍ය වේ.<br>✓ හදිසි ක්‍රියාමාර්ගයක් ලෙස නායයෑම් වලින් ඇති වන අවදානම අවම කිරීමට ව්‍යාපෘති ය අදහස් කරන බැවින්, ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය සැලකිල්ලට ගනිමින් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය නොවේ.<br>✓ ව්‍යාපෘති ය ආරම්භ කිරීමට පෙර අවම කිරීමේ නාය යාම අවම කිරීමට අවශ්‍ය බව සඳහන් කර ඉල්ලීමක් කළ යුතුය.<br>✓ අවම කිරීමේ කටයුතු නියමිත ව්‍යාපෘති යක් තුළ නොමැතිව සංවේදී ප්‍රදේශය ක ක්‍රියාත්මක කරන්නේ නම් අවම කිරීමේ කටයුතු පාලනය කරනු ලැබේ. |
| මාර්ග සහ කාර්ය ඒකකය දුම්රිය දෙපාර්තමේන්තුව | ඊ.එම්.එස්.පී.කේ. දීගල මහතා , ප්‍රධාන ඉංජිනේරු | ✓ මෙම ප්‍රදේශය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධිකරණ බල ප්‍රදේශය යටතේ පවතී.<br>✓ SLR ය මේ සඳහා කිසිදු විරෝධයක් නොමැති අතර අවම කිරීම ඉතා අවශ්‍ය බව පවසයි.<br>✓ ඉදිකිරීම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර කොන්ත්‍රාත්කරු විසින් විස්තරාත්මක ව්‍යාපෘති සැලැස්ම සහ කාල උපලේඛන SLR වෙත ලබා දිය යුතු අතර, කොන්ත්‍රාත්කරු විසින් PMU සහ SLR අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගත යුතුය.<br>✓ අනෙකුත් මතු වූ කරුණු<br>• කම්කරුවන් ආරක්ෂක ගැටළු සම්බන්ධයෙන් ඔහුගේ උපදෙස් සහ මගපෙන්වීම් පිළිපැදිය යුතුය.<br>• වෙනත් මාර්ග ප්‍රවේශයක් නොමැති ස්ථාන සඳහා ද්‍රව්‍ය ප්‍රවාහනය කොන්ත්‍රාත්කරුවගේ ඉල්ලීම් අනුව සිදු කෙරේ.<br>• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් දුම්රිය ද්‍රව්‍ය ප්‍රවාහනය, කොඩි කරුවන්ගේ වැටුප් සහ SLR වෙතින් සපයන ලබන අනෙකුත් සම්පත් සඳහා වූ වියදම් ඇතුළු සියලු වියදම් දරනු ලැබේ.<br>• අවම කිරීමේ ක්‍රියාමාර්ගයෙන් අනතුරුව ව්‍යාපෘතිය නිසි ලෙස භාර දිය යුතුය.<br>• අවම කිරීමෙන් පසු SLR විසින් නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ.<br>• ඉදිකිරීම් අතරතුර කොන්ත්‍රාත්කරු විසින් පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතා කළ යුතු බව අවධාරණය කෙරේ. |

| | | |
|---|---|---|
| | | • සෑම විටම, කොන්ත්‍රාත්කරුවා දුම්රිය ප්‍රවාහනය සඳහා ආරක්ෂිත සහ පහසු ගමන් මාර්ගයක්, ගමනාගමන ආරක්ෂක ක්‍රමයන්, බාධක, කොඩි කරුවන් සහ කොඩිකරුවන් සහ රාත්‍රී වැඩ සඳහා, විදුලි පහන් සහ ආලෝකකරණය සැපයිය යුතුය.<br>• කොන්ත්‍රාත්කරු විසින් තාවකාලික වැසිකිළි පහසුකම් භාවිතා කළ යුතුය.<br>• සේවා යටිතල පහසුකම් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අධීක්ෂණය යටතේ ප්‍රතිස්ථාපනය කළ යුතුය.<br>✓ ඉදිකිරීම් අපද්‍රව්‍ය/කැණීම් ද්‍රව්‍ය මහජනයාට/ගමන් කරන්නන්ට කරදරයක් නොවන ලෙස බැහැර කළ යුතු බවද සඳහන් කෙරේ. |

**ඇමුණුම III: රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රියා පටිපාටිය.**

පරිසර නිෂ්කාශනය සඳහා දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය විසින් යෝජිත අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය

i. SLR විසින් පිළිගත යුතු නිර්මාණය: ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් අවශ්‍ය අනුමැතිවල ස්වභාවය සම්බන්ධයෙන් විධිමත් ඉල්ලීමක් සමඟ SLR වෙත සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කළ යුතු වේ. එමෙන්ම PMU විසින් ඉහත ලේඛන සකස් කළ යුතු අතර ඒවා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවට ලේඛන ඉදිරිපත් කළ යුතුය.

ii. දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුව විසින් යෝජනාව ඇගයීමට ලක් කර ව්‍යාපෘති සාකච්ඡාවට කැඳවිය හැකිය. PMU විසින් අවශ්‍යතාවයට අනුව අවශ්‍ය සාකච්ඡාව ලබා දිය යුතුය.

iii. SLR හි අනුමැතිය මත, ස්ථානයට ප්‍රවේශ වීම, ව්‍යුහයන් ඉදි කිරීම සහ අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා SLR සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය අතර එකඟතාවයක් අත්සන් කිරීම කරනු ලබයි.

**ඇමුණුම IV: අධ්‍යන කණ්ඩායම**

| නම | තනතුර | කාර්යභාරය |
|---|---|---|
| එස්. එම්. ඒ.එස් දිසානායක | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ /පරිසර අංශය /NBRO | ජ්‍යේෂ්ඨ පරිසර විද්‍යාඥ |
| ප්‍රභාත් ලියනාරච්චි | විද්‍යාඥ / පරිසර අංශය /NBRO | පරිසර විද්‍යාඥ |
| ඒ .ජී. රන්දොබගේ | ව්‍යාපෘති සහකාර | ජනවිකාස දත්ත රැස් කිරීම/වාර්තාව සකස් කිරීම |

**ඇමුණුම V: යොමු ලැයිස්තුව**


1. සාමාන්‍ය පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම සඳහා ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති ය සඳහා කොන්ත්‍රාත්කරුගේ බැදීම් -AIIB
2. පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව - ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය -AIIB
3. නැවත පදිංචි කිරීමේ සැලසුම් රාමුව - ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය -AIIB
4. කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධනය, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ගස් කැපීම (පාලන) පනත
5. සංගණන හා සංඛ්‍යාලේඛන වාර්තාව **(2012),** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව